محمد - ﷺ - خاتم النبيين - سنهالي

# නබි තුමාගේ ජීවන චරිතය





جمعية الدعوة بالزلفي

جمعية الدعوة والإرشاد وتوعية الجاليات بالزلفي

199

هاتف: ٤٢٣٤٤٦٦ ٠١٦ - فاكس: ٤٢٣٤٤٧٧ ٠١٦

# නබිත්වයට පෙර අරාබිවරුන්

## محمد - ﷺ - خاتم النبيين – اللغة السنهالية

جمعية الدعوة والإرشاد وتوعية الجاليات في الزلفي
Tel: 966 164234466 - Fax: 966 164234477

**محمد - ﷺ - خاتم النبيين**

**أعده وترجمه للغة السنهالية:**

**جمعية الدعوة والإرشاد وتوعية الجاليات بالزلفي**

**الطبعة الثانية: ١٤٤٢/٩ هـ**


**ح شعبة توعية الجاليات بالزلفي، ١٤٣٥هـ**

فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر

شعبة توعية الجاليات بالزلفي

محمد - ﷺ - خاتم النبيين – الزلفي

٤٨ ص؛ ١٢ × ١٧ سم

ردمك : ١-٤٤-٨٠١٣- ٦٠٣-٦٧٩

(النص باللغة السنهالية )

١-الشيرة النبوية أ. العنوان

ديوي ٢٣٩ ١٤٣٤/١٠٦٧٩

رقم الإيداع : ١٤٣٤/١٠٦٧٩

ردمك : ١-٤٤-٨٠١٣- ٦٠٣-٦٧٩

## السيرة النبوية

# නබිත්වයට පෙර අරාබිවරුන්

අරාබිවරුන් අතර පිළිම වැඳුම ප්‍රධාන ආගමක් ලෙස පැවැත් වින. සත්‍ය (ශක්තිමත්) ආගමට එරෙහි පිළිම වැඳුමෙහි යෙදූ නිසා ඔවුන්ගේ කාල පරිච්ජේදය අයියාමුල් ජාහිලියියා (අඥාන කාලය) යනුවෙන් හැඳින්විය. අල්ලාහ් හැර ඔවුන් වැඳුම්කළ ප්‍රසිද්ධ පිළිමයන් ලෙස හැඳින්වූයේ අල්ලාත්, අල් උස්සා, මනාත් හා හුබල් යනාදීන්ය. නමුත් අරාබිවරුන් අතර ක්‍රිස්තියානින්ද, යුදෙව්වන්ද, ගිනි වැඳුම්කරුවන්ද සිටියහ. එසේම, ඔවුන් අතර නබි ඉබ්රාහීම් (අලෛ) තුමාගේ පරිශුද්ධ ආගම අනුගමනය කළ පිරිස්ද ස්වල්ප වශයෙන් සිටියහ.

ආර්ථික වශයෙන් එහි වාසය කල 'බදව්' යනුවෙන් හඳුනන ගැමියන් සිව්පාවන් තණකෑම සඳහා දක්කන එඬේරවරුන් ලෙසද, නගර වැසියන් ව්‍යාපාර හා ගොවිතැන් කරමින්ද ජීවත් වූහ.ඉස්ලාම් ප්‍රසිද්ධවීමට කලකට පෙර සිට මක්කාව අරාබි අර්ධ ද්වීපයේ වැදගත් වෙළඳ නගරයක් බවට පත්ව තිබින. වෙනත් ප්‍රදේශ මෙන්ම මෙහිද ශිෂ්ඨාචාර ජනපදයන්ද තිබින.

සමාජයිය අතින් එහි අපරාධයන් පිරිහී තිබින. අසරණයන් ගේ අයිතිවාසිකම් පැහැර හැරීම, ගැහැනු දරුවන් (පණ පිටින්) වළලීම, ගරුකම නොසැළකීම, බලවතුන් අසරණයන්ගේ සම්පත් සූරා කෑම, සීමාවෙන් තොරව බහුභාර්ය සේවනයේ යෙදීම, ස්ත්‍රී දූෂණය පැතිරීම

හා අල්ප හේතූන් මත ගෝත්‍රයන් අතර යුද්ධ කිරීම යනාදියන් පිරිහී තිබින. මෙවැන්නන් ඉස්ලාම් ප්‍රසිද්ධ වීමට පෙර අරාබි අර්ධද්වීපයේ පැවැති දූෂිත සිද්ධීන්ය.

කුරෛෂි වරුන්, නබිනායක මුහම්මදු (සල්) තුමාගේ සීයාවූ අබ්දුල් මුත්තලිබ්ගේ ගෝත්‍රය හා ඔහුගේ සම්පත් මුල්කරගෙන ආඩම්බරවෙමින් සිටියහ. අබ්දුල් මුත්තලිබ් දිනක් අල්ලාහ් තමාට පිරිමි දරුවන් දස දෙනෙක් ලබා දෙන්නේ නම්, ඔවුන් අතර කෙනෙකුව දෙවියන් ලඟාවීම සඳහා බිලිදෙන බව භාරවිය. ඔහු භාරවූ පරිදි අල්ලාහ් ඔහුට පිරිමි දරුවන් දස දෙනෙකු ලබා දුන් නේය. ඔවුන් අතර මුහම්මදු (සල්) තුමාගේ පියාවූ අබ්දුල්ලාහ්ද කෙනෙකි. තම භාරය ඔප්පු කිරීමට අබ්දුල් මුත්තලිබ් සැරසූවිට, ‘මෙය මිනිසාගේ පාරම්පරික කාරයයක් නොවන’ බව පවසමින් එය වළක්වාලීමට මිනිස්සු ඉදිරිපත් වූහ.

පසුව ඔවුහු ඒ සඳහා චන්දියක් වශයෙන් අබ්දුල්ලාහ් හා ඔටු වන් දස දෙනා අතර කුසපත් ඇදී (තීරණය කිරී)මටද, එහිදී අබ් දුල්ලාහ්ගේ නම ඇදෙන්නේනම්, ඒ සඳහා ඔටුවන්ගේ සංඛ්‍යාව වැඩි කිරීමටද එකඟ වූහ. ඒ අනුව ඔවුන් කුසපත් ඇදූහ. දස වතාවක්ම අබ්දුල්ලාහ්ගේ නමම ඇදුනේය. පසුව ඒ අනුව ඔවුන් ඔටුවන් සීයයක් කපා බිලි දුන්හ.

අබ්දුල් මුත්තලිබ්ට තම පුත්‍රයන් අතර තම සිතින් ඉමහත් ප්‍රිය කරන පුත්‍රයෙකු ලෙස අබ්දුල්ලාහ් පත්වූයේ, විශේෂයෙන් මෙම සිද්ධියෙන් පසුවය. අබ්දුල්ලාහ් තරුණ වියට පත්වූවිට සාමාන්‍ය මිනිසුන්ට නොවන සේ ඔහුගේ නළලේ (දීප්තිමත්) ආලෝකයක් දිළිසෙන්නට විය. ඔහු වැඩි

වියට පත්වූ කළ ඔහුගේ පියා බණූ සහ්රා සමාජයෙන් ආමිනා බින්ත් වහබ් (වහබ්ගේ දියණිය වන ආමිනා) යන තරුණිය තෝරා ඔහුට ඇය විවාහ කර දුන්නේය. විවාහයෙන් පසු ඔහුගේ නළලේ දිලිසුනු ආලෝකය ආමිනාගේ ඉල ඇට පෙදෙසට පිවිසියේය. අබ්දුල්ලාහ් තම ජීවිතයේ වැදගත් කරුණක් ඉටු කළේය. ආමිනා නබිතුමාව ගැබ්වී මාස තුනෙන් පසු අබ්දුල්ලාහ් වෙළඳ කණ්ඩායමක් සමග සිරියාව කරා පිටත් විය.ආපසු පැමිණෙනවිට අතරමගදී ඔහු අසනීපයට පත්විය. මදී නාවේ බණූ නජ්ජාර් ගෝත්‍රයේ තම මාමාවරුන් වෙත නැවතී සිට එහි මරණයට පත්ව එහිදීම භූමිදානය කරන ලද්දේය.

ආමිනාගේ ගැබ් කාලය සම්පූර්ණවීමෙන් ඇයට ප්‍රසූත වේද නාව ආරම්භ විය. නමුත් ප්‍රසූත වේලාවන්හි අන් ස්ත්‍රීන් ලබන දැඩි වේදනාව හෝ අසීරුතාවය ආමිනාට නොහැඟීය. ක්‍රිස්තු වර්ෂ 570 රබීඋල් අව්වල් මස 12 වැනි සඳුදා දින ෆජ්ර් උදාවීමත් සමගම ආමිනා තම දරුවාව ප්‍රසූත කළාය. මෙම වකවානුව 'ආමුල් ෆීල්' (ඇත් වසර) යනුවෙන් හැඳින්විය.

# ඇත් සටන

අබ්රහා, අබිසීනියා රාජ්‍යයේ රජතුමාවූ නජ්ජාෂිගේ යෙමන් ප්‍රාන්ත නියෝජිතයාය. අරාබිවරු හජ් කර්තව්‍යය සඳහා කඃබාව කරා යාම දුටු ඔහු, 'සන්ආ' ප්‍රදේශයේ විශාල කෝවිලක් (පල්ලි යක්) ඉදිකර, අරාබිවරු හජ් කර්තව්‍යය සඳහා මෙම කෝවිල කරා හැරවීමට අදහස් කළේය. මෙය දැනගත් අරාබි ගෝත්‍රයක් වූ 'බණූ කිනානා' ගෝත්‍රයේ

කෙනෙක් එක් දින රාත්‍රියක් එම පල්ලිය තුලට ඇතුළුවී මල මූත්‍රා පහකොට එය අපවිත්‍ර කළේය. මේ බව ආරංචිවූ අබ්රහා දැඩි කෝපයට පත්වී කාඃබාව විනාශ කිරීම සඳහා යුධභටයන් 60,000 කින් සමන්විත සේනාවක් සමග පිටත්විය. ඔහු තමා වෙනුවෙන් ලොකුම ඇතෙක් තෝරා ගත් තේය. එම සේනාවේ ඇතුන් නව දෙනෙක් සිටියහ. ඔහු සේනාව සමග මක්කාවට ආසන්නව ගොස් මක්කා නගර තුලට පිවිසීමට සූදානම් වූහ. නමුත්, ඇතුන් කාඃබා දෙසට ගමන් නොකර දණ ගසන්නට විය. ඔවුන් අන් දෙසට හැරවූ සැම විටම පෙරළා දුවන් නටද, කාඃබා දෙසට හැරවූවිට දණ ගසන්නටද පටන් ගත්හ.

ඔවුන් මෙලෙස සිටින අවස්ථාවෙහි අල්ලාහ් අබාබීල් නමැති පක්ෂියන් යැව්වේය. ඒවා ඔවුන් මත පිළිස්සූ ගල් දමන්නට පටන් ගත්හ. එමගින් අල්ලාහ් ඔවුන් අනුභවකළ පිදුරු ආකාරයට පත්කළේය. සැම පක්ෂියක්ම ගල් තුනක් බැගින් රැගෙන ආහ. කොණ්ඩ කඩල සේ ගලක් හොටයෙන්ද, ගල් දෙකක් දෙපාවෙන් ද තිබින. පුද්ගලයෙකු මත ගලක් වැටෙන්නේනම්, ඔහුගේ අව යන් කැලි කොට විනාශවන්නට විය. ඔවුන් පලා යාමට පිටත්වී මාර්ගයෙහි වැටෙන්නටද වූහ. අබ්රහා රෝගයට පත්වී ඔහුගේ ඇඟිලිද වැටෙන්නට විය. එනිසා ඔහු අසරණවී කුරුළු පැටියෙක් සේ සන්ආව නගරයට පැමිණ එහි මරණයට පත්විය. කුරෛෂි වරුන් ගෝත්‍ර වශයෙන් වෙන්වී සේනාවට බියෙන් තම තමන්ගේ ආරක්ෂාව සඳහා කඳුවලට නැග සිටියහ. සේනාවට සිදුවූ දේ දුටු ඔවුහූ වහාම ආරක්ෂාවෙන් තමතමන්ගේ නිවෙස් කරා පැමිණීහ. නබිනායක මුහම්මදු (සල්) තුමා

උපත් ලැබීමට දින පනහකට (50) පෙර මෙම සිද්ධිය සිදුවිනි.

අරාබිවරුන් තම දරුවන්ගේ ශක්තිමත් ශරීර වර්ධනය සඳහා ඔවුන්ට තන කිරි දීමට ගැමි වැසියන්ගෙන් ඉල්ලා සිටීම සිරිතක් ලෙස පැවැත්විනි. නබි මුහම්මදු (සල්) තුමා ඉපදු මෙම සමයේ බණූ සඅද් ගෝත්‍රයේ පිරිසක් මෙම කාර්ය සඳහා මක්කාවට පැමිණියහ. ඔවුන්ගෙන් ස්ත්‍රීන් මේ සඳහා නිවෙස් සොයමින් සිටියහ. නබි මුහම්මදු (සල්) තුමාගේ අනාථකම හා දිළිඳුකම නිසා ඔවුහු සැම දෙනා එතුමාව (කිරි දීම සඳහා) ප්‍රතික්ෂේප කළහ. ඔවුන් අතර සිටි හලීමතුස් සඃදියියා යන කාන්තාවද වෙනත් කතුන් සේ නබිතුමාව ප්‍රතික්ශේප කළාය. නමුදු නිවෙස් ගානක් ඇවිදද තම ජීවිතයේ මුහුණ දුන් අසීරුතාවය හා දුෂ්කරතාවය, විශේෂයෙන් එම සාගත වසරෙහි ඇතිවූ දුෂ්කරතාවය එම (තනකිරි දීමේ) කුලිය මගින් පහසුකර ගැනීම සඳහා තමා සමග ගෙන යාමට දරුවෙක් ඇයට නොලැබීය. එනිසා අඩු කුලියට හෝ එම අනාථ දරුවාව භාර ගැනීම සඳහා හලීමා නැවත ආමිනාගේ නිවෙස සොයා ගියාය.

හලීමා මක්කාවට තම සැමියා සමග සෙමින් ගමන් කරන අසරණ කෙට්ටු කොටළුවෙක් මත පැමිණියේය. ආපසු පිටත්වන අවස්ථාවේ නබිතුමා තම ඔඩක්කුවේ තබාගෙන ගියේය. සෙමින් ගමන් කළ කොටළුවා වේගයෙන් ගමන්කර අන් සියලු වාහන පසුකර යන්නට විය. මගෙහි (රොත්තපිටින්) ගමන් කළ වාහන හිමියන් මේ ගැන ඉමහත් පුදුමයට පත්වූහ. හලීමා, තම තන යේ කිරි අල්පවත් නොඑරීම නිසා තම දරුවන් අධික කුස ගින්

නෙත් සැමදා අඬමින් සිටි නමුත් නබිතුමාට කිරි පොවු පසු තම තනයෙන් කිරි එරෙන්නට පටන් ගත්' බව පැවැසුවාය.

තවද, 'මෙම දරුවාට කිරි දීමේ විශේෂ භාග්‍ය ලැබීමෙන් බණූ සඅද් ගෝත්‍රයේ වියලී තිබූ තම ඉඩම සහ සිව්පාවන් සරුවත්වූ බවද තමාගේ දිළිඳුකම් හා අසරණකම් සියල්ල පොහොසත් වන ආකාරයට වෙනස්වූ බවද' ඇය පැවැසුවාය. නබිතුමා හලීමාගේ රැකවරණයේ වසර දෙකක කාලයක් ගත කළේය. ඇයද නබි තුමාට විශේෂ සැළකිලි දැක්වුවාය. එතුමාගේ සමහර කාර්යයන් හා එතුමාට සිදුවන අසාමාන්‍ය දේ ගැන හලීමා ගැඹුරෙන් වටහා ගෙන සිටියේය. වසර දෙකකින් පසු හලීමා මක්කාවෙහි සිටින එතුමාගේ මව හා සීයා වෙත කැඳවාගෙන ගියේය. නමුදු එතුමා ගේ භාග්‍යයෙන් තමාට සිදුවූ විශේෂ වෙනස්වීම් දුටු හලීමා, නබි තුමාව දෙවැනි වරටත් තමාගේ රැකවරණයේ තබාගැනීම සඳහා ආමිනාගෙන් බලවත් ඉල්ලීමක් කළාය. ආමිනා එයට එකඟවිය. එහෙයින්, හලීමා ඉමහත් ප්‍රීතිය සහ භාග්‍ය පිරිවරමින් යතීම් (අනාථ) දරුවා රැගෙන ආපසු බණූ සඅද් ගෝත්‍රයේ තම නිවස බලා පැමිණියාය.

# පපුව පැළීම

නබි මුහම්මදු (සල්) තුමාට වයස හතරක් ළඟාවන සමයේ දිනක් එතුමා තම කිරි සහෝදරයා (හලීමාගේ පුත්‍රයා) සමග කුඩාරමට නුදුරින් සෙල්ලම් කරමින් සිටින අවස්ථාවේ හලීමාගේ පුත්‍රයා දිව ආවේය. ඔහුගේ මුහුණේ ආවේග සකුණු තිබින. ඔහු තම මවගෙන් තම කුරෙෂ් සහෝදරයා (ට සිදුවූ දේ) බැලීමට පැමිණෙන මෙන් ඉල්ලා

සිටියේය. හලීමා සිදුවූ දේ ගැන විමසීය. ඔහු 'නියතව සුදු ඇඳුම් ඇඳගත් දෙන්නෙක් අප අතර සිටි ඔහුව අල්ලා බිමට තබා ඔහුගේ පපුව පැලීය...' යනුවෙන් පවසා එම සිද්ධිය සම්පූර්ණ කිරීමට පෙර හලීමා නබිතුමා කරා වේගයෙන් දිව ගියාය. එවිට එතුමා එම ස්ථානයේ නොසැලී සිටීමද, එතුමාගේ මුහුණ තද කහ පාටවී තිබීමද, එතුමාගේ ශරීරයෙහි පාට වෙනස්වී තිබීමද දිටීය. ඇය එතුමාගෙන් සිදුවූ දේ පිළිබඳව විමසූ වාය. එවිට එතුමා 'නියත වශයෙන්ම සුදු ඇඳුමෙන් සැරසූ දෙන් නෙක් මාව අල්ලා මාගේ පපුව පැලීය. පසුව මාගේ හෘදය පිටට ගෙන එයින් කළු පැහැති දෙයක් ඉවත්කර එය විසි කිරීමෙන් පසු හෘදය ශීතල ජලයෙන් සේදූහ. පසුව එය ආපසු ශරීරයතුල තබා පපුව මත පිරිමැදීය. පසුව මා සිටි තැන මාව හැර ඔවුන් දෙදෙනා සැඟවී ගියහ' යනුවෙන් පැවැසීය. හලීමා පපුවෙහි පැලූ ස්ථානය පිරිමදා බැලුවාය. නමුත් එහි කිසියම් සළකුණක් හෝ ඇයට දක්නට නොලැබීය. පසුව මුහම්මදු (සල්) තුමාව රැගෙන තම කූඩාරමට පැමිණියාය.

පසු දින උදාවීමෙන් පසු හලීමා නබි මුහම්මදු (සල්) තුමාද රැගෙන මක්කාවේ එතුමාගේ මව වෙත ගෙන ගියාය. දරුවා පිළිබඳව හලීමාට අධික ඇල්මක් තිබියදීත්, බලාපොරොත්තුවක් නොවෙන වේලාවේ හලීමා ආපසු පැමිණීම ගැන ආමිනා මවිතයට පත්වූවාය. එයට හේතුව ආමිනා හලීමාගෙන් විමසූවාය. නැවත නැවත කිහිප වරක් විමසීමකින් පසු හලීමා පපුව පැලීමේ සිද් ධිය පැහැදිළි කළාය.

මදීනාවේ සිටින බණූ නජ්ජාර් ගෝත්‍රයේ තමාගේ මාමාවරුන් මුන ගැසීම සඳහා ආමිනා තම යතීම් (අනාථ) දරුවාද රැගෙන පිටත්වූවාය. එහි කලක් ගතකර ආපසු පැමිණෙන අතර මගදී 'අබ්වා' යන ස්ථානයේ ඇය අභාවයට පත්වී එහිදීම භූමදානය කරනලදී. මෙසේ නබිතුමාට තමාගේ හයවන වියේදී තම මවද අහිමවිය. පසු එතුමා තම සීයාවූ අබ්දුල් මුත්තලිබ්ගේ රැකවරණ යට පත්විය. ඔහු එතුමාට අධික වගකීමෙන් රැකවරණයදී ආදරය කර රැකගෙන සිටියේය.

නබිතුමාට වයස අටක් සම්පූර්ණවන විට අබ්දුල් මුත්තලිබ්ද අභාවයට පත්විය. පසු දරුවන් වැඩියෙන් සිටින හා අඩු ආර්ථික යෙන් පසුවන එතුමාගේ ලොකු පියාවූ අබූ තාලිබ් එතුමාට රැක වරණය දුන්නේය. ඔහුද, ඔහුගේ බිරිඳද තමාගේ දරුවෙකු ලෙස සැළකූහ. යතීම් නබිතුමා ලොකු වියට පත්වන තෙක්ම ලොකු පියාගේ රැකවරණයෙහි පසුවේය. මෙම අවධියේදී නබිතුමාගේ ආරම්භක ජීවිතය පටන් ගත්තේය. එතුමා සත්‍යතාවය හා නම් බුව යනාදි ගුණාංගයෙන් හැසිරීමෙන් එතුමා එම සංඥා නාම යෙන් හැඳුණන්නට විය. අල් අමීන් (නම්බුකාරයා) පැමිණෙනවා යැයි පවසන්නේනම් එයින් නබිතුමාගේ පැමිණීම තහවුරුවේ.

එතුමා යෞවනයෙක් වී වැඩිවියට පත්වීමත් සමග තම ජීවිත හා ආර්ථික කටයුතු සඳහා පෞද්ගලිකව ක්‍රියාකිරීමට අදහස් කළේය. තම කාර්යයන් හා ඉපයීමේ ගමන තමා විසින්ම පටන් ගත්තේය. එනිසා එතුමා සමහර

කුරෙෂිවරුවන්ගේ බැටඑවත් කුලියට මේච්චල් කරන්නට විය.

<u>නබිතුමා (ෂාම්) සිරියා දේශය කරා ගමන් කරන වෙළඳ කණ්ඩායමක් සමග ගමන් කළේය. එම ව්‍යාපාරයේ වැඩි කොට සක් වූයේ කුවෙලිද්ගේ දියණියවූ කදීජාගේය. ඇය ධනවත් ස්ත්‍රියෙකි. මෙම වෙළඳ ගමනේ කදීජාගේ භාණ්ඩ සඳහා භාර කාරයා ලෙස ඇයගේ වහලෙක්වූ මෛසරා කටයුතු කළේය.</u>

නබිතුමාගේ භාග්‍යයෙන් හා නම්බු කමින් මින් පෙරට වඩා කදීජාගේ වෙළඳාමෙහි අධික ලාභයන් ලැබෙන්නට විය. මෙසේ ලාභ අධිකවීමේ හේතුව පිළිබඳව කදීජා තම වහළාවන මෛසරාගෙන් විමසීය. එවිට මෛසරා ‘අබ්දුල්ලාහ්ගේ පුත්‍රයා මුහම්මද් බින් අබ්දුල්ලාහ් වෙළඳ කටයුතුවල යෙදී සිටියේය. ඔහු කරා අධික මිනිසුන් (සෙනග) පැමිණිහ. මෙම අධික ලාභය කිසියම් අපරාධයකින් තොරව ලැබින’ යනුවෙන් කීය. මෛසරා කිව දේ කදීජා සාවදානයෙන් අසාගෙන සිටියාය. ඇය මීට පෙරද මුහම්මදු බින් අබ්දුල්ලාහ් ගැන යම් කරුණු දැන සිටියාය. එබැවින් ඇයට එතුමා පිළිබඳව තද ඇල්මක් ඇතිවිය.

කදීජා මීට පෙර විවාහවී ඇයගේ සැමියා අන්තාවූ කාන්තා වකි. එනිසා මුහම්මදු (සල්) තුමා සමග විවාහවී නව ජීවිතයෙහි පිවිසීමට ඇය අදහස් කළාය. මේ ගැන එතුමාගේ කැමැත්ත ලබාගැනීම සඳහා තමාගේ ඥාති කාන්තාවක් එතුමා වෙත යැවු වාය. එවිට එතුමා විසිපස් වියට පත්ව සිටියේය. එම කාන්තාව කදීජා විවාහ කිරීම සඳහා එතුමාගේ කැමැත්ත පැතුවාය. එයට එතුමා එකඟවිය. එනිසා විවාහය සිදුවිය. ඔවුන් දෙන්නා භාග්‍ය

වන්තයන් වූහ. නබි මුහම්මදු (සල්) තුමා කදීජාගේ දේපළ පිළි බඳ කාර්‍යයන් පාලනය කරන්නට විය. මේ සඳහා තම ශක්තිය හා අවධානය යොමු කළේය. කදීජා අඛණ්ඩව ගැබ්වී දරුවන් ප්‍රසූත කළාය. ඇයට සෛනබ්, රුකයියා, උම්මු කුල්සූම් හා ෆාතිමා යන ගැහැනු දරුවන්ද, කාසිම් හා අබ්දුල්ලාහ් යන පිරිමි දරුවන්ද සිටීහ. පිරිමි දරුවන් කුඩා අවදියේ අන්තුාවූහ.

# නබිත්වයට පත්වීම

නබි මුහම්මදු (සල්) තුමා තමාට වයස හතලිහ (40) ලඟාවන අවධියේ මක්කාවට සමීපයෙන් පිහිටා ඇති හිරා නම්වූ කඳු ගුහාවේ තනියමින් හා අසමානයෙන් සිටීමටද එහි රෑ හා දහවල් කාලය ගතකිරීමටද විය. එතුමා හතලිස්වන වියට පත්වූ සමයේ රමලාන් මාසයේ විසි එක්වන (21) දින රාත්‍රී කාලයේ හිරා ගුහා වේ එතුමා සිටී අවස්ථාවේ දේව දූත ජිබ්රීල් (අලෛ) තුමා පැමිණ ‘පාරායනා කරන්න’ යනුවෙන් පැවැසීය. එතුමා ‘මා පාරායනා කිරීමට නොදනිමි’ යනුවෙන් කීය. මෙසේ ජිබ්රීල් (අලෛ) තුමා දෙවැනි හා තෙවැනි වතාවන්ද පාරායනා කරන මෙන් පැවැසීය. තෙවැනි වතාවේදී එතුමා නබි තුමාට...

﴿ إِقْرَأْ بِاسْمِ رَبِّكَ الَّذِىْ خَلَقَ، خَلَقَ الإِنْسَانَ مِنْ عَلَقٍ، إِقْرَأْ وَرَبُّكَ الأَكْرَمُ، الَّذِىْ عَلَّمَ بِالْقَلَمِ، عَلَّمَ الإِنْسَانَ مَالَمْ يَعْلَمْ ﴾ (العلق: ١-٥)

‘සියලු දේ මැවූ ඔබ දෙවියාගේ නාමයෙන් පාරායනා කරනු, ඔහු අලක් යන ස්ථාවරයේ සිට මිනිසා මැව්වේය. පාරායනා කරනු, ඔබගේ දෙවියා මහත් ධානවන්තයෙකි.

ඔහු පෑනය මගින් මිනිසාට නොදන්නා සැමදේ ඉගෙන්නුවේය.'(96 : 1-5) යනුවෙන් (පාරායනා කරන මෙන්) පැවැසීය. පසු එතුමා එතැන් සිට ආපසු පිටත්ව ගියේය. මුහම්මදු (සල්) තුමාට එහි රැඳී සිටීමට නොහැකිවිය. එනිසා වැවුලන සිතින් තම නිවෙසට හැරී කදීජා වෙතට පැමිණ මාව පොරවන්න, මාව පොරවන්න යනුවෙන් පැවසීය. බිය යන තෙක් එතුමාව පොරවා තැබුවේය. එතුමා තමාට සිදුවූ දේ ගැන කදීජාට පැහැදිළිකර, තමා තම ජීවිතය ගැනද බියවන බව පැවසීය. එවිට කදීජා 'එසේ නොව, අල්ලාහ් මත දිවුරා කියමි, අල්ලාහ් ඔබතුමාට කිසි දිනක නින්දා නොකරන්නේය. නියතවශයෙන්ම ඔබතුමා ඥාතීන් සමග එක්ව සිටින්නේය අසීරුතාවයන් ඉවසන්නේය. නැති බැරි අයට උපයා දෙන්නේය. අමුත්තන් සළකන්නේය. යථාර්තයෙන් දුෂ්කරතාව යට ලක්වූවන්ට උපකාර කරන්නේය' යනුවෙන් කීය.

දින කීපයකින් පසු එතුමා ඇඳහීම අඛණ්ඩව කරගෙන යාම සඳහා හා රමලාන් මාසයේ ඉතිරි දිනයන් සම්පූර්ණ කිරීම සඳහා හිරා ගුහාව කරා නැවත ගියේය. එම මාසය අවසන්වූ විට මක්කාව යාම සඳහා හිරාවේ සිට බැසීය. 'බතනුල් වාදී' නමැති ස්ථානය ලඟාවූ විට දේවදූත ජිබ්රීල් (අලෛ) තුමා අහසය හා පොළොව අතර සිංහාසනයක මත අසුන් ගනිමින් නබිතුමා වෙත පැමිණීය. පසු පහත සඳහන් අල්ලාහ්ගේ වැකිය පහළ වීය.

﴿يَا أَيُّهَا الْمُدَّثِّرْ، قُمْ فَأَنْذِرْ، وَرَبَّكَ فَكَبِّرْ، وَثِيَابَكَ فَطَهِّرْ، وَالرُّجْزَ فَاهْجُرْ﴾

(المدثر: ١-٥)

(පොරෝනයකින්) පොරවමින් සිටින්නානෙණි, ඔබ නැගිට මිනිසුන්ට) අවවාද කරනු. තවද ඔබ දෙවියාව ආඩම්බර කරනු. තවද ඔබ ඇඳුම් පැළඳුම් පවිත්‍රව තබා ගනු. තවද අපවිත්‍රකම පිළිකුල් කරනු. (74:1-5) පසුව අඛණ්ඩව අල්ලාහ්ගේ වහී (පණිවුඩය) පහළවිය.

නබි මුහම්මදු (සල්) තුමා, තම කැඳවීම ආරම්භ කළ විගස එම විශ්වාසනීය කැඳවීම එතුමාගේ ශ්‍රේෂ්ඨවූ බිරිඳ පිළිගත් අතර, ඇය අල්ලාහ් තආලාගේ ඒකත්වය හා තම ගෞරවණීය සැමියාගේ නබිත්වය සඳහා සාක්ෂි දැරීය. ඇය ප්‍රථමයෙන් ඉස්ලාමය වැළඳගත් තැනැත්තිය වූවාය. තම මව හා සීයාගෙන් පසු තමාට රැකවරණය දී තමාව ඇතිකළ ලොකු තාත්තා අබූ තාලිබ්ට ප්‍රති උපකාරයක් කිරීම සඳහා නබිතුමා ඔහුගේ පුත්‍රයෙක්වූ අලී තමා වෙත රැඳවා ගෙන තම රැකවරණයේ ඇතිකිරී මටත්, ඔහු වෙනුවෙන් වියදම් කරන්නටත් විය. මෙම සමයේ අලීද සිත් පැහැදිලිවී විශ්වාස කළේය. පසු කදීජාගේ වහළෙක් වූ සෙයිද් බින් හාරිදාද ඔවුන් සේ විශ්වාස කළේය. නබි (සල්) තුමා තම හිත මිත්‍රයාවූ අබූබක්ර් (රලි) තුමාට මේ ගැන දැන් විය. ඔහු කිසිඳු කලබලයෙකින් තොරව විශ්වාස කර සත්‍ය කළේය.

කැඳවීමේ කාර්‍යය රහසිගතව පැවැතිය. රහසිගතව යනු වෙන් හැඳින්වන්නේ නබිතුමාගේ මිත්‍රයන්, එතුමා පිළිපදින්නන් හා එතුමගේ කැඳවීමෙන් ඉස්ලාමය වැළඳගන්නන් රහසිගතව රැස්වන ස්ථානයේ කැඳවීමකි. නියත වශයෙන්ම අධික පිරිස් එතුමාව විශ්වාස කළහ. නමුත්, ඔවුහු තම ඉස්ලාමය ගැන බිය වන්නට වූහ. මක්නිසාදයත්, ඔවුන්ගෙන් කෙනෙකුගේ කාර්‍ය ප්‍රසිද්ධ

වෙන්නේද ඔහු ඉස්ලාමයෙන් පිටමන් කිරීම සඳහා කුරෙෂ් කාෆිර්වරුන්ගේ විවිධාකාර වේදනාවන්ට මුහුණ දීමට සිදුවිය හැකි නිසාය.

# ප්‍රසිද්ධ කැඳවීම්

නබි මුහම්මදු (සල්) තුමා වසර තුනක කාලයක් පෞද්ගලික කැඳවීමෙහි යෙදීමෙන් පසු අල්ලාහ් මෙම වැකිය පහළ කළේය.

﴿ فَاصْدَعْ بِمَا تُؤْمَرُ وَأَعْرِضْ عَنِ الْمُشْرِكِيْنَ ﴾ (الحجر-٩٤)

'එබැවින් ඔබට අණකර ඇති දේ ඔවුන්ට ප්‍රසිද්ධියෙන් පවසනු. (වැඳුම් පිදුම්හි) හවුල් කරන්නන් ප්‍රතික්ෂේප කරනු. (අල්කුර්ආන්-15:94)

දිනක් නබි මුහම්මදු (සල්) තුමා සෆා කඳුවෙ සිට කුරෙෂ් වරුන් කැඳවීය. එහි විශාල පිරිසක් රැස්වූහ. ඔවුන් අතර අල්ලාහ්ට හා ඔහුගේ දූතයාවූ නබිතුමාට කුරෙෂිවරුන්ගෙන් තද විරෝදියාවූ තම ලොකු තාත්තා අබූ ජහ්ල්ද පැමිණ සිටී යේය. රැස්ව සිටින කුරෙෂිවරුන් අමතා නබිතුමා 'මෙම කන්දට පිටු පස ඔබලා විනාශ කිරීමේ අපේක්ෂාවෙන් විරෝධීන් රැඳී සිටින බව මා පවසන්නේනම් එය ඔබලා පිළිගන්නේද?' යනු වෙන් ඔවුන්ගෙන් ඇසීය.

ඔවුහු 'අප ඔබගෙන් සත්‍යතාවය හා විශ්වාසය හැර අන්කිසි දෙයක් නොදිටින්නෙමු'. යනුවෙන් කීහ. පසුව නබිතුමා 'ඔබලාට දැඩි වේදනාවන් ඇති බව මා අවවාද කරමි. යනුවෙන් පවසා ඔවුන් අතර ඇති පිළිම් වැඳුම අතහැර (වැඳුම් පිදුම් සඳහා) අල්ලාහ් තආලා කරා කැඳවීමට

ආරම්භ කළේය. ජනතාව අතර සිටි අබූ ලහබ් වහාම නැගිට 'ඔබට විනාශය ඇතිවේවා. මේ සඳහාද අපිව රැස්කළේ? යනුවෙන් පැවැසීය. එවිට අල්ලාහ් තආලා මසද් නමැති පහත සඳහන් (කුරාන්) පරිච්ජේදය පහළ කළේය.

﴿تَبَّتْ يَدَا أَبِيْ لَهَبٍ وَّتَبَّ، مَا أَغْنَى عَنْهُ مَالُهُ وَمَا كَسَبَ، سَيَصْلَى نَارًا ذَاتَ لَهَبٍ، وَّامْرَأَتُهُ حَمَّالَةَ الْحَطَبِ، فِيْ جِيْدِهَا حَبْلٌ مِّنْ مَّسَدٍ﴾ (المسد: ١-٥)

අබූලහබ්ගේ දෑත් විනාශ වේවා. ඔහුද විනාශ වේවා. ඔහුගේ දේපල හා ඔහු ඉපැයූ දේද ඔහුට පල නොවීය. ඔහු සීඝ්‍රයෙන් දැල්වෙන ගින්නෙහි පිවිසේ. තවද දර උසුලන ඔහුගේ බිරිඳද ගින්නෙහි පිවිසේ. ඇයගේ බෙල්ලහි ඇඹරුණු ඉඳි ලණු තමා (තිබේ). (එයින් එයද විනාශයට පත්වේ.) (අල්කුරුආන්-111:1-5)

නබිතුමා කැඳවීමේ කටයුතුහි නිරතවී සිටි අතර, මිනිසුන් රැස්වන ස්ථානවල එය ප්‍රසිද්ධ කිරීමටද ඔවුන් ඉස්ලාම් කරා කැඳවීමටද පටන් ගත්තේය. කාඃබාවහි එතුමා නැමඳුම ඉටු කළේය. මුස්ලිම්වරුන්ට කාෆිර්වරුන්ගේ හිරිහැරය අධිකවිය. යාසිර්, (ඔහුගේ බිරිඳ) සුමෙයියා හා ඔවුන්ගේ පුත්‍රයා අම්මාර් යන්නන්ට සිදුවූ දේ නිදසුනකි. ඔහුගේ දෙමාපියන් ෂහීද්වරුන් (පරිත්‍යාග ශීලීන්) සේ දිවි පිදුහ. සුමෙයියා ඉස්ලාම් වෙනුවෙන් ප්‍රථමයෙන් දිවි පිදුකළ කාන්තාවකි. මෙය සිදුවියේ ඉස්ලාමය වැළඳගත් හේතුව නිසාය. තවද, බිලාල් බින් රිබාහ් අල් හබෂී (රලි)ද උමයියා බින් ගලෆ් හා අබූජහ්ල් යන අයගේ වේදනාවට ලක්විය.

බිලාල් (රලි) අබූබක්ර් (රලි) තුමා මාර්ගයෙන් ඉස්ලාම් ධර්මය වැළඳ ගත්තේය. ඔහුගේ හාම්පුතාවූ උමයියා බින්

ගලෆ් මේ බව දැනගත් විගස ඉස්ලාම් ධර්මය අත හැරීම සඳහා විවිධ ආකාරයෙන් වේදනාවට ලක් කළේය. නමුත් බිලාල් (රලි) ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කොට ඉස්ලාමය ස්ථිරව වැළඳ ගත් තේය. උමයියා ඔහුව අල්ලා දම්වැලින් බැඳ, මක්කා වට පිට ගෙනවිත් දැඩි උෂ්ණයෙන් යුත් වැලි (ගොඩ) මත තබා, ඔහුගේ පපුව මත ලොකු ගලක් තබා ඔහුද ඔහුගේ යහලුවන්ද කෲර ලෙස කසයෙන් පහර දුන්හ. නමුත් බිලාල් අහද් අහද් (අල්ලාහ් කෙනෙකි, අල්ලාහ් කෙනෙකි) මෙන් පවසමින් සිටියේය. මෙම අවස්ථාවේ අබූබක්ර් (රලි) තුමා එතැනින් පසුකර යන්නට විය. එබැවින් අබූබක්ර් උමයියාගෙන් ඔහුව මිළදී ගෙන අල්ලාහ්ගේ මාර්ගයෙහි නිදහස් කළේය.

මෙවැනි අපරාධ සිදුවීම් වැළක්වීමේ උපායක් වශයෙන් නබි තුමා ඔවුන්ගේ ඉස්ලාමය ප්‍රසිද්ධ කිරීම තහනම් කළාය. ඔවුන් රහස්ව රැස්කළේ මෙනිසාය. මක්නිසාදයත්, ඔවුන් ප්‍රසිද්ධව රැස්කළේද, මුෂ්රික්වරුන් ඔවුන් යහමග යාම හා ධර්මය ඉගෙනගැනීම වළක්වෙති යන්නෙහි කිසිඳු සැකයක් නොමැත. යම් විට මෙය දෙපිරිස් අතර ගැටුම්ද ඇති කළ හැක. මෙම ගැටුම් මුස්ලිම්වරුන්ගේ සුළු ප්‍රමාණය හා ශක්තිය නිසා ඔවුන්ට විනාශයක් ගෙනදිය හැක. එනිසා සැඟවී කිරීම උපායයෙකි. නබි (සල්) තුමා කුරෛෂ් කාෆිර්වරුන්ගේ හිරිහැරයන් ඉවසා ගෙන මුෂ්රික්වරුන් අතර කැඳවීමේ හා ඇඳහීමේ කාර්‍ය ප්‍රසිද්ධි යෙන් කළාය.

# අබීසීනියාවට හිජ්රත් යාම

තම ඉස්ලාමය එළිකරන මුස්ලිම්වරුන්ට විශේෂයෙන්, ඔවුන් ගෙන් අසරණයන්ට මුෂ්රික්වරුන් නොකඩවා හිරිහැර කරමින් සිටියදී, අබීසීනියාවේ නජ්ජාෂි රජතුමා වෙත ඔහුගේ රැකවරණය පතා පලා යන ලෙස නබි මුහම්මදු (සල්) තුමා තම අනුගාමික යන්ගෙන් ඉල්ලා සිටියේය. මුස්ලිම් වරුන්ගෙන් වැඩි පිරිසක් තමන්ට හා තම පවුලේ අයට කුරෛෂිවරුන් ගැන (හිරිහැර කරේදැයි) බියට පත්ව සිටිහ. මෙය නබිත්වයේ පස්වැනි වසරේ දීය. එනිසා මුස්ලිම්වරුන් 70 දෙනෙක් පමණ තම පවුල් සමග පලා යාමට පිටත්වූහ. ඔවුන් අතර උස්මාන් බින් අෆ්වාන් (රලි) ද ඔහුගේ බිරිඳවන නබිතුමාගේ දියණියවූ රුකයියාද සිටියහ. මුස්ලිම්වරුන් අබීසීනියාවේ නැවතීම වළක් වාලීමට කුරෛෂි වරුන් කුමන්ත්‍රණය කළහ.

කුරෛෂිවරුන් අබීසීනියාවේ රජතුමාට තෑගිබෝග යවමින් පලාගිය මෙම අය තමන් වෙතට භාරදෙන මෙන් ඉල්ලීමක් කළ අතර, මොවුන් ඊසා නබිතුමාට හා එතුමාගේ මවට බැණ දොස් පවරන බවද රජතුමාට දැනුම් දුන්හ. මේ ගැන නජ්ජාෂි ඔවුන්ගෙන් විමසීය, ඔවුහු ඉස්ලාම් ධර්මය ඊසා නබිතුමා ගැන පවසන කරුණු හා සත්‍යය ඔහුට පැහැදිලි කළහ. එහෙයින්
ඔහු ඔවුන් ආරක්ෂා කළේය. ඔවුන් කුරෛෂ්වරුන්ට භාරදීම ප්‍රතික්ෂේප කළේය.

මෙම වසරේ දිනක් නබිතුමා කාඃබා (හරම් ෂරීෆ්) වෙත ගියේය. එහි අධික කුරෛෂිවරුන් රැස්ව සිටීහ. නබිතුමා

ඔවුන් අතර සිට, බලාපොරොත්තු නොවන පරිදි (سورة النجم) සූරා නජ්ම් යන පරිච්ඡේදය පාරායනා කිරීමට පටන් ගත්තේය. මෙම කාෆිර්වරුන් මින් පෙර අල්ලාහ්ගේ වැකියන් නොඅසා සිටිත. කුමක්නිසාදයත්, ඔවුන් නබි මුහම්මදු (සල්) තුමාගෙන් කිසිවෙක් කණ්දී නොඇසීමට ඔවුහු අතර ගිවිසගෙන සිටිත. නමුත් මෙම කුරාන් පරිච්ඡේදය පාරායනා කළවිට ආකර්ශණීය මෙම දේව වැකියන්ට ඔවුන්ගේ කණ් යොමුවිය. ඔවුන් සැම දෙනා තම නෙත් යොමා එය සවන්දීමට වූහ. ඔවුන්ගේ සිතෙහි එය හැර අන්කිසි දෙයක් නොහැඟීය. මුහම්මදු (සල්) තුමා {فَاسْجُدُوْا لِلّٰهِ وَاعْبُدُوْا} 'අල්ලාහ්ට සුජූදු (හිස නැමීම්) කරන්න. ඔහුටම වැඳුම් පිදුම් කරන්න.' යන වැකිය තෙක් පාරායනා කර හිස නැමී සුජූදු කළේය. ඔවුන් කිසි කෙනෙකුට සිත් මෙල්ල නොවී ඔවුන්ද සුජූදු කරන්නට වූහ. මෙහි සහභාගි නොවූ මුෂ්රික්වරුන් සැම මාර්ගයෙන්ම සුජූදු කළ අයට දෝශා රෝපනය කළහ. මෙම අවස්ථාවේ ඔවුන් නබිතුමා ගැන අසත්‍ය යන් කතා කළහ. ඔවුන් නබිතුමා තමන්ගේ පිළිමයන් ප්‍රශංසා කළ බවද එම පිළිමයන්ගේ නිර්දේශයන් පිළිගැනෙන බව එතුමා පාවැසූ බවද කීහ. ඔවුහු, සුජූදු කළ අය එයින් වළක්වා ලීම සඳහා මෙසේ දෝශාරෝපනය කළහ.

# උමර් (රලි) ඉස්ලාමය වැළඳ ගැනීම

උමර් බින් කත්තාබ් (රලි) තුමා ඉස්ලාම් ධර්මය වැළඳ ගැනීම මුස්ලිම්වරුන්ට උපකාරයක් ලෙස පැවැතිය. නබි මුහම්මදු (සල්) තුමා ඔහුට ෆාරුක් යනුවෙන් නම්

කළේය. කුමක්නිසාදයත්, අල්ලාහ් තආලා ඔහු විසින් සත්‍යය හා අසත්‍යය වෙන් කළේය. ඉස්ලාම් ධර්මය වැළඳ දින කීපයෙන් පසු දිනක් උමර් (රලි), නබිතුමාගෙන්, නබිතුමණී, අපි සත්‍යයේ නොසිටින්නේද? යනු වෙන් ඇසීය. එයට නබිතුමා එසේ නොවේ අපි සත්‍යයයේම සිටින්නෙමු යනුවෙන් පැවැසීය. එසේනම් ඇයි අපි මෙය සඟවා සිටින්නේ? යනුවෙන් උමර් (රලි) නැවැත ඇසීය. මුහම්මදු (සල්) තුමා අර්කම් (රලි) ගේ නිවසේ තමා සමග සිටි මුස්ලිම්වරුන් ගෙන් හම්සා බින් අබ්දුල් මුත්තලිබ් යටතේ පිරිසක්ද, උමර් බින් කත්තාබ් යටතේ පිරිසක්ද වන පරිදි කොටස්කර, ඔවුන් සමග කැඳවීම් මාර්ගයේ තම ශක්තිය උපුටා පෙන්නුම් කිරීම හා එම කැඳවීම ප්‍රසිද්ධ කිරීම සඳහා මක්කා මාර්ගයන් කරා පිටත්විය.

කැඳවීමේ කටයුක්ත හෙළිාදැකීමේ කාර්‍යයෙහි කුරෛෂි වරුන් විවිධ ක්‍රමයන් උපයෝගී කළහ. වේදනාවන්, අක්‍රමික තාවන්, අපරාධයන් හා චාටු (ආශා) කථාවන් කළහ. නමුත්, මේ සියල්ල ඔවුන් ඉස්ලාම් ධර්මයේ නිරතවීමට හා මුස්ලිම් වරුන් අධිකවීමට හේතුවිය. මෙම අවස්ථාවේ ඔවුහු නව ක්‍රියා මාර්ගයක් සඳහා සැළසුම් කළහ. මුස්ලිම්වරුන් හා බණූ හාෂිම් වරුන් සමග සම්බන්ධ තාවයන් සහමුලින්ම අත්හිටුවිය යුතුයි.

මුස්ලිම්වරුන් සමග වෙළඳ කටයුතුවල යෙදීම, විවාහ කිරීම, උපකාර කිරීම හා ආශ්‍රය කිරීම යනාදීන් නොපැවැත්විය යුතුයි. යනුවෙන් පත්‍රයක ලියා එහි සැම දෙනාම අත්සන් කර එය කාඃබා බිත්තියේ එල්ලා තැබූහ. මුස්ලිම්වරුන් මක්කාවෙන් පිටත්ව ෂිඅබු අබූතාලිබ් යන

ප්‍රපාතය කරා යාමට සිදුවිය. එහිද මුස්ලිම්වරුන් දුෂ්කර වේදනාවන්ට ලක්වූහ. කුස ගින්නටද, අධික පීඩනයටද ඔවුන්ට මුහුණ පෑමට සිදුවිය. ඔවුන්ගෙන් ශක්තිවන්තයන් තම සම්පත්වලින් වියදම් කළහ. කදීජා (රලි) තමාගේ සම්පත් සියල්ල වියදම් කළාය. ඔවුන් අතර රෝග පැතිරීය. පිරිසක් මෙමගින් මැරුම් දකින තරමට පත්වූහ. නමුත් ඔවුන් ස්ථිරයෙන් හා ඉවසීමෙන් සිටිහ. ඔවුන්ගෙන් කිසියම් කෙනෙක් හෝ ආගම අතහැර නොගියහ. මෙසේම වසර තුනක් පීඩනයෙන් ගත තළහ.

පසු බණූ හාෂිම්වරුන් සමග කිට්ටුම නෑකම් පවත්වන කුරෙෂ්වරුන්ගෙන් වැදගත් පිරිසක් පත්‍රයෙහි කරුණු නිශ්ඵල කරලීමටද ඒ බව ජනතාවට දැනුම් දීමටද ඉදිරිපත්වූහ. එම පත්‍රය (කාඃබා බිත්තියෙන් ගලවා) පිට ගෙනවිට එහි බිස්මික (අ)ල්ලාහුම්ම (باسمك اللهم) 'අල්ලාහ්ගේ නාමයෙන් ආරම්භ කරමි' යන සුළු කොටස හැර අන් සියල්ල වෙයන් විසින් විනාශකර ඇති බව පෙණින. මෙම අවහිරයන් අවසන් වීමෙන් පසු මුස්ලිම්වරුන් හා බණූ හාෂිම්වරුන් මක්කාවට ආපසු පැමිණියහ. නමුත් කුරෙෂ්වරුන් මුස්ලිම්වරුන්ට විරුද්ධවීමේ ස්ථාවරයේ නිරතව සිටිහ.

# ශෝක වසර

අබූතාලිබ්ගේ ශරීරය පුරාම රෝගය පැතිරෙන්නට විය. ඔහු ඇතිරිල්ලෙහි (ඇඳෙහි) නිරතවන්නට විය. ඔහු මරණ (සක්රාත්) වේදනාවට ලක්වී සිටි අතර, මිය යාමට පෙර ඔහු 'ලාඉලාහ ඉල්ලල්ලාහ්' (වැඳුම් පිදුම් කිරීමට සුදුස්සා

අල්ලාහ් හැර අන් කිසිවෙකු නොමැත) යන වැකිය කීමේ අපේක්ෂාවෙන් නබි මුහම්මදු (සල්) තුමා ඔහුගේ සිරස අසලෙහි සිටියේය. නමුත්, ඔහු සමග සිටින ඔහුගේ අයහපත් මිත්‍රයන් හා ඔවුන්ගේ නායකයවූ අබූ ජහ්ල්ද එය වළක්වමින් හා 'ඔබ පියානන්ගේ හා මුතුන් මිත්තන්ගේ ආගම අත නොඅරිනු' යනුවෙන් ඔහුට පවසමින් සිටීහ. එනිසා ඔහු ෂිර්කයේම (අල්ලාහ්ට හවුල් කරන මගෙහි) අන්ත්‍රාවිය. ඔහු ඉස්ලාම් ධර්මය නොවැළඳ මරණයට පත්වීම නබි මුහම්මදු (සල්) තුමාගේ ශෝකය දෙගුණයක් වීමට හේතුවිය.

අබූතාලිබ් අන්ත්‍රාවී මාස දෙකක් ළඟාවන සමයේ නබිතුමාගේ බිරිඳවූ කදීජා (රලි) තුමියද අන්ත්‍රාවීය. මේ හේතුවෙන් නබිතුමා ඉමහත් ශෝකයට පත්විය. තම ලොකු පියාවූ අබූතාලිබ්ගේ හා තම බිරිඳවූ කදීජා (රලි) තුමියගේ වියෝවෙන් පසු නබිතුමාට තම සමාජයෙන් හිරහැර හා පීඩා වන් අධිකවන්නට විය. (මෙම මරණ සිදුවීමෙන් නබි මුහම්මදු (සල්) තුමා අධික ශෝකයට පත් බැවින් මෙම වසර ආමුල් හුස්න් (ශෝක වසර) යනුවෙන් හැඳින්විය.)

# තායිෆ් ගමන

මුස්ලිම්වරුන්ට කුරෙයිෂ්වරුන්ගේ හිරිහැරයන්, අක්‍රමිකතා වන්, අපරාධයන්, හා නින්දාවන් නොකඩවා සිදුවින. කුරෙයිෂ් වරුන් යහමගට යොමු කිරීම පිළිබඳව නබිතුමා වෙහෙසට පත්ව සිටියේය. තායිෆ් වැසියන්ට අල්ලාහ් සුමග පෙන්විය හැක යන අදහසින් තායිෆ් ගැන නබිතුමා සිතන්නට විය. තායිෆ් කරා ගමන් කිරීම අපහසු

කරුණෙකි. මක්තිසාදයන්, තායිෆ් නගරයට යන මග වටා විශාල කඳු තිබීම නිසා එම මගෙහි ගමන් කිරීම දුෂ්කර කාර්‍යයෙකි. නමුත් අල්ලාහ්ගේ මාර්ග යෙහි සෑම පහසුවිය හැක. නමුත් තායිෆ් වැසියන් එතුමා පහත් අන්දමින් නින්දාකර පලා එවූහ. ඔවුන් කුඩා ළමයින් උසිගැන් වූහ. ඔවුන් නබිතුමාගේ විලුඹ දෙකෙහිම රුධිරය එන තෙක් ගල් ගැසූහ.

එනිසා නබිතුමා මේ සියල්ල ඉවසාගෙන අධික ශෝකයට පත්වී මක්කාව කරා ආපසු පැමිණෙන්නට විය. මෙම අවස්ථාවේ දේවදූත ජිබ්රීල් (අලෛ) තුමා කඳු සඳහා නියමවූ මලක් (දේව දූත) වරයා සමග පැමිණ නබිතුමාව කැඳවා ‘ඔබ කැමැති දේ අණ කිරීම සඳහා අල්ලාහ් තආලා ඔබ වෙත කඳු සඳහා නියමවූ මලක්වරයා එවා ඇත’ යනුවෙන් පැවැසීය. එවිට කඳු සඳහා නියමවූ මලක්වරයා ‘මුහම්මද් තුමණි, ඔබ කැමැති වන්නේනම්, මක්කාව වටකර ඇති මෙම (මක්කාව පිරිවරා ඇති) කඳු දෙක මගින් මා ඔවුන් විනාශ කරන්නම්.’ යනුවෙන් නබිතුමාගෙන් ඇසීය. එවිට නබිතුමා ‘නමුත්, අල්ලාහ් තආලා ඔවුන් මගින් ෂිර්ක් (හවුල්) නොකර, එකම අල්ලාහ්ට වැඳුම් පිදුම් කරන පරම් පරාවක් බිහි කිරීම මා අපේක්ෂා කරමි’ යනු වෙන් පැවැසීය.

මුෂ්රික්වරුන් නබිතුමාගෙන් ආශ්වර්‍යය ක්‍රියාවන් පෙන්වන මෙන් තර්ක කරමින් සිටියා පමණක් නොව, එය වරින්වරද අසන්නට වූහ. වරක් ඔවුන් චන්ද්‍රයාව දෙකට පළා පෙන්වන මෙන් ඉල්ලා සිටිහ. නබිතුමා මේ ගැන අල්ලාහ්ගෙන් ඇසීය. එවිට ඔවුන් චන්ද්‍රයා දෙකට පැළී

තිබීම දිටිහ. කුරෛෂිවරුන් මෙම ආශ්චර්‍ය්‍යය සිද්ධිය දීර්ඝ වේලාවක් දුටුවමින් සිටි නමුත් ඔවුන් විශ්වාස නොකළහ. එනමුත් ඔවුන් 'මුහම්මදු අපට හූණියම් කළේය.' යනුවෙන් කීහ. එවිට පුද්ගලයෙක් 'ඔහු ඔබලාට හූණියම් කළාට මිනිසුන් සැම දෙනාට හූණියම් කිරීමට ඔහුට ශක්තියක් නොමැත.

එනිසා (වෙළඳ කටයුතුවෙහි පැමිණෙන) මගීන්ගෙන් විමසා බලන්න. යනුවෙන් කීවේය. එවිට මගීන් පැමිණිහ. ඔවුන්ගෙන් මේ ගැන විමසූහ. ඔවුහූ 'එසේ මයි. නියතවශයෙන්ම අපිද එය දුටුවෙමු.' යනුවෙන් පැවැසූහ. නමුත් කුරෛෂ්වරුන් (මෙය දැන සිටි අතර) ඔවුන්ගේ කුෆ්ර් (ප්‍රතික්ෂේපයෙ)හි හිතුවක්කාර කමින් නිරතව සිටිහ. මෙම හඳ පැළීමේ සිද්ධිය මීට වඩා ඉමහත් ආශ්චර්යය සිද්ධියක් සඳහා පසුබිමක්විය. එය අල්ඉස්රා හා අල් මි:රාජ් යන්නේය.

# ඉස්රා හා මි:රාජ්

නබි මුහම්මදු (සල්) තුමා තායිෆ් සිට ආපසු පැමිණීමෙන් පසු එහිදී එතුමාට සිදුවූ දේද, අබුතාලිබ් හා කදීජා (රලි) අන්ත්‍රාවීමද, එයින් පසු සිදුවූ කුරෛෂ්වරුන්ගේ දුෂ්කර හිරහැරයන්ද නබි තුමාගේ සිතෙහි අධික ශෝකයන් ඇති කළේය. එම අවස්ථාවේ නබිතුමාට අල්ලාහ් තආලාගේ සැනසුම ලැබෙන්නට විය.

නබිත්වයේ දසවන වසර රජබ් මස විසිහත්වන දින රාත්‍රියේ, නබි මුහම්මදු (සල්) තුමා නින්දෙහි පසුවෙමින් සිටියෙදී දේවදූත ජිබ්රීල් (අලෛ) තුමා 'බුරාක්' ද රැගෙන

නබිතුමා වෙත පැමි ණිය. බුරාක් යනු අකුණක් සේ වේගයෙන් ගමන් කරන පිහාටු දෙකකින් යුත් අශ්වයාට සමාන සතෙකි. එය මත නබි (සල්) තුමා අසුන් කරවාගෙන පලස්තීනයේ පිහිටා ඇති බයිතුල් මුකද් දස් නමැති දේවස්ථනය වෙත පැමිණිය. පසු එතැන් සිට එතුමා අහසට (මි:රාජ්හි) උස්සාගෙන ගියේය. එහි එතුමා තම දෙවියා ගේ මහා සාධකයන් (ආධාරයන්) දිටීය. අහසේදී පස්වේල නැම දුම එතුමාට අනිවාර්යවිය. එම රාත්‍රියේම නබි මුහම්මදු (සල්) තුමා පැහැදිලි සිහින්ද දැඩි ස්ථිරයෙන්ද මක්කාවට පැමිණිය.

පසු දින එළිවීමත් සමගම නබිතුමා කාඃබාවට ගොස් තමාට සිදුවූ දේ ගැන මිනිසුන්ට පැහැදිලි කළේය. එවිට කාෆිර්වරුන් එතුමාව අසත්‍ය කිරීමටත් විහිළු කිරීමටත් පටන් ගත්හ. පසු එහි සිටි පිරිසක් එතුමාව අධෛර්‍යමත් කිරීම සඳහා බයිතුල් මුකද්දිස් දේවස්ථානය ගැන තමන්ට වර්ණනා කරන මෙන් එතුමාගෙන් ඇසීය. නබිතුමා ඔවුන්ට ඒ ගැන ටිකටික වර්ණනා කරන්නට විය. මෙයින් මුෂ්රික්වරුන් සෑහීමට පත් නොවූහ. නමුත් ඔවුන් 'අපිට වෙනත් සාධකයන් අවශ්‍යයයි' යනුවෙන් කීහ. එබැවින් නබි මුහම්මදු (සල්) තුමා, මක්කා දිසාවෙන් සිට පැමිණෙන කණ්ඩායමක් අතර මගදී තමාට මුණ ගැසුනු බව පවසා ඔවුන්ගේ ලක්ෂණයන්ද ඔවුන් සතු ඔටුවන්ගේ සංඛ්‍යාවද ඔවුන් පැමිණ වේලාවද පැහැදිලි කළේය.

නබිතුමා සත්‍ය පැවැසුවද කාෆිර්වරුන් එතුමාව ප්‍රතික්ෂේප කිරීමෙහිද, මුරණ්ඩු කිරීමෙහිද, සත්‍ය නොකිරීමෙහිද නිරතවී සිටිහ. මෙම (ඉස්රා) ගමන ගියදා

උදේ දේවදූත ජිබ්රීල් (අලෛ) තුමා පැමිණ නබිනායක මුහම්මදු (සල්) තුමාට පස්වේල සලාතය (නැමදුම) ඉටු කිරීමේ ක්‍රමය හා එහි වේලාවන් ගැන ඉගෙන් වීය. මින් පෙර සලාතය උදේ හා සවස රකඅත් දෙකක් බැගින් පමණක් තිබින.

කුරෛෂ්වරුන් සත්‍යයට විරුද්ධවීමෙහි නිරතවී සිටි සමයේ නබි මුහම්මදු (සල්) තුමා මක්කාවට පැමිණෙන මිනිසුන්ට කැඳවීම් කිරීමේ කාර්‍යයෙහි යෙදී සිටියේය. එතුමා මිනිසුන්ට ගමනේදී හා ඔවුන් නැවැතී සිටින ස්ථානවලදී ඉස්ලාම් ධර්මය උපුටා පෙන්වා එය පැහැදිලි කරන්නට විය. එතුමාගේ ලොකු පියෙකු වන අබූ ලහබ්ද නබිතුමා යන තැන් කරා ගොස් එතුමා ගැනද එතුමාගේ කැඳවීම් ගැනද මිනිසුන්ට අවවාද කරමින් සිටියේය. වරක් එතුමා මදීනාවේ සිට පැමිණි පිරිසට කැඳවීම් කළේය. ඔවුහු එය සාවදානයෙන් අසා සිට එතුමා පිළිගැනීමටත් එතුමා විශ්වාස කිරීමටත් එකඟවූහ.

මදීනා වැසියන් ඉතා සමීපයෙන් නබි වරයෙකු පැමිණෙන බව යහූදි (යුදෙව්) වරුන්ගෙන් දැන සිටීහ. එනිසා නබිතුමා ඔවුන්ට කැඳවීම් කළ විගස එම නබිතුමා මෙතුමා බව හඳුනා ගෙන ඉස්ලාමය වැළඳ ගැනීමට කඩිනම් වූහ. ඔවුන් 'මෙම කාර්යයෙහි යහූදිවරුන් තමන්ට වඩා ඉදිරියට නොයායුතුයි' යනු වෙන් කීහ. ඔවුන් හය දෙනෙකි. දෙවන වසරේ ඔවුන් දොළොස් දෙනෙක් පැමිණ නබිතුමා වෙත රැස්වූහ. එතුමා ඔවුන්ට ඉස්ලාම් ධර්මය ඉගැන්විය.

ඔවුහු මදීනාවට ආපසු ගමන් කරන විට කුර්ආනය ඔවුන්ට ඉගැන්වීම සඳහා හා ඉස්ලාම් ධර්මයේ නීතිරීති පැහැදිලි කිරීම සඳහා මුස්අබ් බින් උමෛර් යන අය ඔවුන් සමග යැව්වේය. මදීනා වැසියන් අතර ප්‍රයෝජනයක් ඇති කිරීමට මුස්අබ් බින් උමෛර්ට හැකිවිය. ඔහු වසරකින් පසු මක්කාවට ආපසු පැමිණි විට ඔහු සමග මදීනා වැසියන් පිරිමින් හැත්තෑ දෙන්නෙක්ද ස්ත්‍රීන් දෙන්නෙක්ද සිටීහ. නබි මුහම්මදු (සල්) තුමා ඔවුන් රැස්කළේය. ඔවුහු නබිතුමාගේ (ඉස්ලාම්) ධර්මයට උපකාර කරන බවද, එතුමාගේ අණ පිළිපදින බවද එතුමා සමග ගිවිස ගත්හ. පසු ඔවුහූ මදීනාව කරා ආපසු පිටත්ව ගියහ.

# කැඳවීමේ නව මූලස්ථානය

මදීනාව සත්‍යතාවයටද, සත්‍යවන්තයන්ටද රැකවරණය හා අභය ලබාදෙන ස්ථානයක් වශයෙන් පරිවර්තනය විය. එනිසා මුස්ලිම්වරුන් මදීනාව කරා හිජ්රත් (පලා) යාමට පටන් ගත්හ. නමුත් කුරෙයිෂිවරුන්, මුස්ලිම්වරුන් හිජ්රත් යාම වලක්වාලීමට අධිෂ්ඨානය කළහ. එනිසා සමහර මුහාජිර්වරුන්ට (හිජ්රත් යන්නන්ට) විවිධ වේදනා හා හිරිහැරයන් කරන්නට වූහ. මුස්ලිම්වරුන් කුරෙයිෂ්වරුන්ට බියවී රහසිගතව හිජ්රත් යන්නට විය. උමර් (රලි) තුමාගේ හිජ්රත් ගමන වීරකමට හා අභියෝග යට සාදකයක් ලෙස පැවැතීය. එතුමා තම කඩුව පැළඳ, දූන්න ඉස්සා කාඃබාව කරා පිටත්ව එහි සක්මන් (වට කිරීම) කළේය.

පසු ඔහු මුෂ්රික් වරුන්ගෙන් 'කවරෙකු තම බිරිඳ වැන්දඹු කිරීමට හෝ තම දරුවා අනාථ කිරීමට කැමැති වන්නේද ඔහු මා කරා පැමිණෙන්න. මා හිජ්රත් යන්නෙමි' යනුවෙන් අභි යෝග කරමින් පිටත්විය. එතුමාගේ ගමන වළක් වාලීමට ඔවුන් කිසි කෙනෙකුට ධෛර්ය නොවීය. අබූබක්ර් (රලි) තුමා හිජ්රත් යාම සඳහා නබිතුමාගේ අවසරය පැතීය. එවිට නබිතුමා 'ඔබ ඉක්මන් නොවන්න. ඔබට අල්ලාහ් සඟයෙක් ලබාදීමට හැක' යනුවෙන් අබූබක්ර් (රලි) තුමාට පැවැසීය. මෙසේ අධික මුස්ලිම්වරුන් හිජ්රත් ගියහ. මෙය දුටු කුරෛෂි වරුන්ට පිස්සු (උම්මත්තකය වීමට) හැදෙන්නට වූහ.

නබිතුමාගේ කාර්යයෙහි ශ්‍රේෂ්ඨකම හා එතුමාගේ කැඳවීම ගැන ඔවුන් බියට පත්වූහ. එනිසා ඔවුහු මේ ගැන සාකච්ඡා කර නබිතුමා මරා දැමීමට ඒකමතිකව තීරණය කළහ. අබූ ජහ්ල් 'අපගේ සෑම ගෝත්‍රයෙකින්ම ශක්තිමත් තරුණයෙකු බැගින් තෝරා ඔවුන් අතට කඩු දී, ඔවුන් මුහම්මද්ව වටකර, එක් මිනිසෙක් කැපූ සේ (සෑම දෙනා එකට) කැපිය යුතු බව මා අදහස් කරමි. එවිට එම වරද්ද සෑම ගෝත්‍රයන්ටම හිමිවේ. ඊට පසු, මිනිසුන් සියලු දෙනාටම විරුද්ධවීමට බණූ හාෂිම් වරුන් ශක්ති නොලබති' යනුවෙන් පැවැසීය. මෙම රහස් තීරණය ගැන අල්ලාහ් තම ශ්‍රේෂ්ඨ නබිතුමාට දැන්විය. එනිසා නබිතුමා අබූබක්ර් (රලි) තුමා සමග හිජ්රත් යාමට තීරණය කළාය. තමා, තම නිවසෙහි සිටින බව මිනිසුන් සිතීම සඳහා එදින රාත්‍රියේ තම ස්ථානයේ නිදා ගන්නා ලෙස අලී බින් අබී තාලිබ් (රලි) ගෙන් නබිතුමා ඉල්ලා

සිටියේය. ඔහුට කිසියම් අවහිරයක් නොසිදුවන බවද දැන්විය.

කුමන්ත්‍රණකාරයන් පැමිණ නිවෙස වටකරමින් සිට, ඇති රිල්ලෙහි සිටි අලි (රලි) තුමා දකිමින් එය නබිතුමා බව සිතූහ. එනිසා ඔවුන් තම තීරණය ඉටුකර එතුමා මරා දැමීම සඳහා නබිතුමා පිටවෙන තෙක් බලාපොරෙත්තුවෙන් සිටීහ. ඔවුන් වටකර සිටිද්දී නබිතුමා ඔවුන්ගේ හිස මත පස් ටිකක් ඉස්සා පිටත්විය. අල්ලාහ් ඔවුන්ගේ පෙනීම ඉවත්කළේය. එනිසා ඔවුහු නබිතුමා පිටත්වීම නොදිටිහ. නබිතුමා, අබුබක්ර් (රලි) තුමා සොයා ගියේය. පසු එතුමන් දෙදෙනා සැතපුම් පහක දුරක් ගමන්කර තව්ර් ගුහාවෙහි සැඟවී සිටීහ.

කුරෛෂ් තරුණයන් ඉර උදාවන තෙක් එතුමා පිටත්වීම බලාපොරොත්තුවෙන් සිටීහ. ඉර උදාවීමෙන් පසු නබිතුමාගේ ඇතිරිල්ලෙහි සිටි අලි (රලි) තුමා නැගිටමින් පැමිණීය. ඔහු ඔවුන්ගේ අතට අහුවිය. නබි (සල්) තුමා ගැන ඔවුහූ එතුමාගෙන් විමසූහ. ඔහු නබිතුමා ගැන කිසිවක් නොපැවැසීය. එනිසා ඔහුට පහර දෙමින් ඇදගෙන ගියහ.

නමුත් එයින් කිසිදු පලක් නොලැබින. පසුව කුරෛෂිවරුන් සැම තැන්හි එතුමාව සෙවීම සඳහා සොයන්නන් එවූහ. කවරෙකු හෝ එතුමාව පණපිට හෝ අපණපිට ගෙනෙන්නේද ඔහුට ඔටුවන් සීයයක් දෙන බව පැවැසීහ. මෙසේ ඔවුන් නබිතුමා සොයාගෙන ගුහා දොරටුවටම ලඟාවූහ. ඔවුන්ගෙන් යමෙකු ඇබී (බිම) බලන්නේද ඔවුන් දෙදෙනා දකින තරමට ලඟාවූහ.

නබිතුමා පිළිබඳව අබූබක්ර් (රලි) තුමාගේ දුක අධිකවිය. එනිසා නබිතුමා අබූබක්ර් (රලි) තුමාට 'අපි දෙන්නෙක් සිටින බවද ඔබ සිතන්නේ? මෙහි තෙවැන්නා ලෙස අල්ලාහ් සිටී. ඔබ කණගාටු නොවන්න. නියත වශයෙන්ම අල්ලාහ් අප සමග සිටින්නේය' යනුවෙන් කීය. නමුත් ඔවුහූ මෙම දෙන්නා නොදිටීහ.

මෙම ගුහාවෙහි දින තුනක් රැඳී සිට මදීනාව කරා පිටත්වූහ. එය දීර්ඝ මාර්ගයෙකි. ඉරෙහි ඌෂ්ණයද අධිකයෙන් පැවැතීය. දෙවැනි දින සවස් වරුවේ කූඩාරමක් අසලට ළඟාවූහ. එහි උම්මු මඃබද් යනුවෙන් හඳුන්වන කාන්තාවක් දුටූහ. ඇයගෙන් ආහාර පානයන් ඉල්ලා සිටීහ. ඇය වෙත මේච්චලට යා නොහැකි අසරණවූ කෙට්ටු, කිරි බිංදුවක් හෝ නොමැති එළුවෙක් හැර වෙන කිසිවෙක්වත් ඔවුන් නොදිටීහ. එහෙයින් නබිතුමා එළුවා ලඟට ගොස් කිරි බුරුල්ල අතින් පිරිමැද කිරි දොවන්නට විය. එයින් ලොකු භාජනයකට කිරි පුරවන්නට විය. එය දුටු උම්මු මඃබද් පුදුමයට පත්ව සිටීය. පසු පිපාසයෙන් මිදෙන තෙක් ඔවුන් සැමදෙනා එය පානය කළහ. පසු නබිතුමා දෙවන වරටත් කිරි දොවා භාජනය පුරවා එය උම්මු මඃබද්ට භාරදී තම ගමන ආරම්භ කළේය.

මදීනා වැසියන් මුහම්මදු (සල්) තුමාගේ පැමිණීම අපේක්ෂා කරමින් සිටීහ. ඔවුන් සැමදා මදීනාවේ පිටසිට එතුමාගේ ඒම බලාපොරොත්තුවූහ. නබිතුමා මදීනාවට පිවිස දින ඔවුන් සතු ටින් ප්‍රශංසාකර පිළිගත්හ. එතුමා මදීනාවෙ සානුවේ පිහිටි කුබා යන ස්ථානයේ බැසීය. එහි දින හතරක් රැඳීසිට ඉස්ලාම්හි ප්‍රථම දේවස්ථානය වන

මස්ජිදුල් කුබා දේවස්ථානයට එහිදී අත්ති වාරම තැබීය. පස්වන දින මදීනාවට ගියේය.

අන්සාර්වරුන් (උපකාර කළ මදීනා වැසියන්) අධික පිරිස් නබිතුමා කැඳවාගෙන යාමටද, තමන්ගේ නිවසෙහි එතුමාට ආගන්තුක සංග්‍රහය කර එමගින් ගෞරවය ලැබීමටද ආශා කළහ. එනිසා ඔවුහු ඔටුවාගේ කඩිවාලම අල්ලා ගත්හ. නබි තුමා ඔවුන්ට ස්තුති පුද කරමින් 'මෙය අත අරින්න. නියත වශයෙන්ම මෙය අල්ලාහ්ගේ අණට කීකරුවේ.' යනුවෙන් පැවැසීය. අල්ලාහ් අණකළ ස්ථානය කරා ගොස් එය දණගැසීය. පසු එය නැගිට මදක් ඇවිදීමෙන් පසු ආපසු පැමිණ පළමු ස්ථානයෙහි දණ ගැසීය. මේ දක්වා නොබැස සිටි නබිතුමා මෙහිදී බැසීය. මෙම ස්ථානය මස්ජිදුන් නබවි දේවස්ථානයට අයත් ස්ථානය විය. නබිතුමා අබූ අයියූබ් අල් අන්සාරීගේ නිවසෙහි ලැගුම් ගත්තේය. අලි බින් අබූතාලිබ් නබිතුමාගෙන් පසු දින තුනක් මක්කාවෙහි රැඳී සිට මදීනාව කරා පිටත්ව කුබා යන ස්ථානයේ නබිතුමා සමග එක්විය.

# මදීනාවේ නබිතුමා

නබි මුහම්මදු (සල්) තුමා ඔටුවා දණගැසූ ස්ථානය හිමි කාරයාගෙන් මිළදීගෙන එහි තම මස්ජිදය (දේවස්ථානය) ඉදි කළාය. මුහාජිරීන් (එතුමා සමග මක්කා සිට පැමිණ මිත්‍රයන්)හා අන්සාරීන් (උපකාර කළ මදීනා වැසියන්) අතර සහෝදරත්වය ඇති කළාය. සැම අන්සාර්වරුන්ටම මුහාජිර්වරයෙකු බැගින් සහෝදරකර, ඔවුන්ගේ සම්පත්වලට කොටස්කරුවන් කළාය. මුහාජිර්වරුන් හා

අන්සාර්වරුන් එකට වැඩ කරන්නට පටන් ගත්හ. සහෝදරත්වය ඔවුන් අතර අධිකවන්නට විය.

කුරෛෂිවරුන්ට මදීනා යහූදිවරුන් (යුදෙව්) සමග සම්බන්ධ තාවයන් පැවැත්වින. එනිසා ඔවුන් මුස්ලිම්වරුන් අතර ප්‍රශ්ණ හා බේද ඇතිකිරීමට තැත් කළුහ. තවද ඔවුන් මුස්ලිම්වරුන්ට අවවාද කරමින්ද, ඔවුන් අවසන්කරන බව තර්ජන කරමින්ද සිටිහ. මෙසේ භාහිරයෙන් හා අභ්‍යන්තරයෙන් මුස්ලිම්වරුන්ට අනතුරු පිරිවරමින් තිබින. සහාබිවරුන් (නබිතුමාගේ අනුගාමි කයන්) ආයුධයෙන් තොරව රෑ ගත නොකරන තරමට කාර්‍ය උග්‍රවීය.මෙම භයානක සමයේ අල්ලාහ් තආලා යුද්ධ කිරීමේ අවසරය පහළ කළේය. එනිසා නබිතුමා විරුද්ධවාදීන්ගේ ගැවසීම ඔත්තු බැලීම සඳහා සේනාවක් පිළියෙළ කළේය.

එසේම ඔවුන් මුස්ලිම්වරුන් සමග ගිවිසුම්කර නිදහසේ ඉස්ලාම් ධර්මය ප්‍රචාරය කිරීමටද ඒ අනුව ක්‍රියා කිරීමටද කට යුතු සලස්වන තෙක්, මුස්ලිම්වරුන්ගේ ශක්තිය පෙන්වීම මගින් ඔවුන්ට තම බලය තහවුරු කිරීමට වෙළඳ ගෝත්‍රයන්ට මගෙහි අවහිර කිරීමට සූදානම් කළේය. මේ වනවිට නබිතුමා සමහර ගෝත්‍රයන් අතර සුහද ගිවිසුම්ද කර සිටියේය.

# බද්ර් යුද්ධය

නබි මුහම්මදු (සල්) තුමා, කුරෛෂි වරුන්ගේ වෙළඳ කණ්ඩායමක් මගෙහි බාධා කිරීමට තීරණය කළේය. එනිසා එතුමා මිනිසුන් 313 දෙනෙක් සමග පිටත්විය. ඔවුන් සමග අශ්වයන් දෙන්නෙක් හා ඔටුවන් 70

දෙනෙක් පමණක් සිටිය. කුරෙෂිවරුන්ගේ කණ්ඩායමේ ඔටුවන් 1000 ක් සිටිය. එයට අබූ සුෆ්යාන් නායකත්වය දුන් අතර ඔහු සමග (පමණක්) මිනිසුන් 40 දෙනෙක් සිටිහ.

මුස්ලිම්වරුන් පිටත්ව ඒම දැනගත් අබූ සුෆ්යාන්, මේ ගැන මක්කාවට පණිවිඩයක් යවා ඔවුන්ගෙන් උදව් පැතිය. ඔහු තම ගමන් මාර්ගය වෙනස් කරමින් වෙනත් මාර්ගයකින් ගමන් කළ බැවින් මුස්ලිම්වරුන්ගේ අපේක්ෂාව නොඉටුවිය. කුරෙෂි වරුන් 1000 කින් සමන්විත සේනාවකින් ආහ. එවිට අබූ සුෆ්යාන්ගේ දූතයා ඇවිත් 'වෙළඳ කණ්ඩායම බේරි (ජයපිට) පැමිණෙන බවත්, මක්කාව බලා ආපසු යන ලෙසත් ඉල්ලා සිටියේය. නමුත්, අබූජහ්ල් ආපසු යාම ප්‍රතික්ෂේප කළේය. ඔවුන්ගේ සේනාව බද්ර් කරා යන්නට විය. කුරෙෂි වරුන්ගේ පිටවීම දැනගත් නබිතුමා තම අනුගාමිකයන් සමග සාකච්ඡා කළේය. ඔවුන් සැමදෙනා කාෆිර්වරුන්ගේ සේනාවට මුහුනදී (යුද්ධ කිරී) මට එකඟවූහ.

හිජ්රි (හිජ්රත් ගමනෙන් පසු) දෙවැනි වසරේ රමලාන් මස 17 වැනි සිකුරාදා දින උදේ දෙපිරිසම මුන ගැසින. ඔවුන් අතර යුද්ධය උග්‍රව පැවැත්විය. මුස්ලිම්වරුන්ට ජය ලැබීමත් සමගම යුද්ධය අවසන්විය. මුස්ලිම්වරුන් 14 දෙනෙක් දිවි පුද කළහ. මුෂ්රික්වරුන් 70 දෙනෙක් මරණයට පත්වූ අතර 70 දෙනෙක් අත් අඩංගුවට ගැනු ලැබින. මෙම යුද්ධය පැවැති අවස්ථාවේ නබිතුමාගේ දියණියෙක්වන උස්මාන් බින් අෆ්වාන් (රලි) තුමා ගේ බිරිඳවූ රුකයියා (රලි) තුමිය (මදීනාවේදී) අභාවයට පත්විය. අසනීපයෙන් පෙළෙන තම බිරිඳ සමග මදීනාවේ රැඳී

සිටින මෙන් නබිතුමා කළ ඉල්ලීම අනුව මෙම යුද්ධයට සහභාගී නොවී උස්මාන් (රලි) තුමා තම බිරිඳ සමග මදීනාවේ නැවැතී සිටියේය. යුද්ධයෙන් පසු නබිතුමා, උම්මු කුල්සූම් (රලි) නමැති තම දෙවැනි දියණිය උස්මාන් (රලි) තුමාට විවාහකර දුන්නේය. මෙනිසා එතුමා 'දුන්නූරෙන්' (ආලෝකයන් දෙකක් සතු තැනැත්තා) යනුවෙන් හැඳින්විය. කුමක්නිසාදයත්, ඔහු නබි තුමාගේ දියණියන් දෙන්නෙක් විවාහ කළේය.

බද්ර් යුද්ධයෙන් පසු මුස්ලිම්වරුන් අල්ලාහ්ගේ උපකාරයෙන් සතුට විඳිමින් මදීනාව කරා ආපසු පැමිණිහ. ඔවුන් සමග සිර කරුවන්ද ගනීමත් (යුද්ධයේදී අතහැර ගිය) ද්‍රව්‍යයන්ද තිබ්න. සමහර සිරකරුවන් ඇප මතද සමහරුන් ඇපයෙන් තොරවද නිදහස් වූහ. සමහර උගතුන් මුස්ලිම් දරුවන් දස දෙනාට කිය වීමට හා ලියවීමට ඉගැන්වීමේ ඇපය මත නිදහස්වූහ.

# උහද් යුද්ධය

බද්ර් යුද්ධයෙන් පසු මුස්ලිම්වරුන් හා මක්කාවේ කාෆිර් වරුන් අතර වෙනත් යුද්ධ කීපයක්ද සිදුවිය. මෙයින් උහද් යුද්ධය දෙවැනි යුද්ධයෙකි. මෙම යුද්ධයේ මුස්ලිම්වරුන් නබි තුමාගේ අණට කීකරු නොවූ නිසාත්, ඔවුන්ට නියමකළ කාර්‍ය යන්හි ඔවුන් වරද්ද කළ නිසාත් මුෂ්රික්වරුන්ට ජය ලැබ්න. මෙම යුද්ධය සඳහා මක්කා වැසියන් 3000 කින් සමන්විත යුධ සේනාවක් පිටත්විය. මුස්ලිම්වරුන් 700 දෙනා පමණක් සිටිහ. මෙම යුද්ධයෙන් පසු යහූදීන් පිරිසක් මක්කාවට ගොස් මදීනා

මුස්ලිම්වරුන් සමග යුද්ධ කිරීමට ඔවුන් දිරිගැන්වූහ. ඔවුන් උදව් උපකාර කරන බවද පොරොන්දු වූහ. ඔවුන්ද එය පිළිගත්හ. පසු වෙනත් ගෝත්‍රයන්ද මුස්ලිම්වරුන්ට එරෙහිව යුද්ධ කිරීමට ඔවුහු දිරිගැන්වූහ. ඔවුන්ද එසේම එකඟවූහ. එනිසා මුෂ්රික්වරුන් 10,000 කින් සමන්විත කණ්ඩායමක් සමග සැම තැන් සිටම මදීනා කරා පැමිණිහ.

නබි (සල්) තුමා විරෝධීන්ගේ ගැවසීම දැනගත් විගස තම අනුගාමිකයන් සමග සාකච්ඡා කළේය. එම සාකච්ඡාවේදී ‘මදීනා වටේම කඳු නැති තැන්වල වළ කැපීම’ පිළිබඳ යෝජනා වක් සල්මානුල් ෆාර්සී (රලි) යන සහාබිවරයා ඉදිරිපත් කළේය. (ඒ අනුව) කඩිනමින් අවසන් කිරීම සඳහා සැම මුස්ලිම්වරුන්ම වළ කැපීමේ කාර්‍යයට සහභාගීවූහ. මුෂ්රික්වරුන් මෙම වළ පසුකර යාමට නොහැකිව මසකට ආසන්න කාලයක් රැඳී සිටිහ. පසු අල්ලාහ් කාෆිර්වරුන් කරා තද සුළඟක් එව්වේය. එමගින් ඔවුන්ගේ කූඩාරම් සියල්ල ගැලවී ගියහ. ඔවුන් බියට පත්වී සීඝ්‍රයෙන් තමතමන්ගේ ගම්බිම් කරා ආපසු යන්නට වූහ.

# මක්කා ජය ගැනීම

නබි මුහම්මදු (සල්) තුමා හිජ්රි අටවැනි වසරේ මක්කා වැසි යන් සමග යුද්ධකර මක්කාව ජයගැනීමට තීරණය කළේය. එතුමා රමලාන් මස දසවැනි දින 10,000 කින් යුත් සේනාවක් සමග පිටත්ව, කිසියම් යුද්ධයකින් තොරව මක්කාව තුලට පිවිසීය. කුරෛෂිවරුන් යටහත්

වූහ. අල්ලාහ් මුස්ලිම්වරුන්ට උපකාර කළාය. නබිතුමා ‘මස්ජිදුල් හරාම්‘ දේවස්ථානය කරා ගියේය. එහි කාඃබාව සක්මන් (වටකිරීම්) කර, එහිතුල රකඅත් දෙකකින් සමන්විත සලාතයක් ඉටුකළේය. මින්පසු කාඃබා තුල හා උඩහි තිබී සැම පිළිමයන් කඩා විනාශ කළ පසු නබිතුමා කාඃබාවේ දොරටුවහි රැඳී සිටීය.

කුරෛෂිවරුන් මස්ජිදුල් හරාම් හි පෝළිමෙන් සිටගෙන තමන්ට කුමක් කරයිදැයි බලා සිටිහ. එවිට නබිතුමා ‘කුරෛෂි වරුනි, ඔබලාට කුමක් කරමි යනුවෙන් සිතන්නේද?’ යනු වෙන් ඇසීය. ඔවුහූ ‘ඔබ යහපත් දේ කරන්නාය. ඔබ ගෞරවණීය සහෝදරයාය. ගෞරවණීය සහෝදරයාගේ පුත්‍රයාය’. යනුවෙන් කීහ. පසුව නබිතුමා ‘ඔබලා යාහැක. ඔබලාට නිදහස්ය.’ යනු වෙන් පැවැසීය. මුහම්මදු (සල්) තුමා, තමා වේදනා කළ, තම අනුගාමිකයන් මරණයට පත්කළ, තමාට හිරිහැර කළ හා තමා තම ගමෙන්ම පිටමන්කළ විරෝධීන්ට සමාව දීමෙන් උසස් ආදර්ශයක් පෙන්වා දුන්නේය. මක්කා ජය ගැනීමෙන් පසු අල්ලාහ්ගේ ධර්මය කරා මිනිසුන් කණ්ඩායම් පිට පිවිසෙන්නට වූහ. හිජ්රි දසවැනි වසරේ නබි (සල්) තුමා හජ් කර්තව්‍යය ඉටු කළේය. එය නබිතුමා කළ එකම හජ් කර්තව්‍යයෙකි. එතුමා සමග ලක්ෂයකට අධික පිරිසක් හජ් කර්තව්‍යය ඉටු කළහ. හජ් කර්තව්‍යය ඉටු කළායින් පසු නබිතුමා මදීනාවට පැමිණියේය.

# නබිතුමාගේ අභාවය

හජ් කර්තව්‍යය ඉටුකර පැමිණ මාස දෙකහමාරකින් පසු නබිතුමා අසනීපයට පත්විය. එය දිනෙන් දින අධිකවන්නට විය. මිනිසුන්ට සලාතය ඉමාමත් (නායකත්වයදී එය ඉටු) කිරීමට නොහැකිවූ එතුමා, ඉමාමත් කරන මෙන් අබූබක්ර් සිද්දීක් (රලි) තුමාගෙන් ඉල්ලා සිටියේය. හිජ්රි එකළොස් වැනි වසර රබීඋල් අව්වල් මස දොළොස් වැනි සඳුදා දින නබි මුහම්මදු (සල්) තුමා අභාවප්‍රාප්තවීය. එවිට එතුමාට වසර 63 ක් සම්පූර්ණවී තිබින. මෙම පණිවිඩය සහාබි (අනුගාමික) වරුන් ලද විගස ඔවුන්ගේ සිහි බුද්ධිය නැතිවිය. ඔවුන් එය සත්‍ය නොකළහ. එවිට අබූ බක්ර් (රලි) තුමා නැගිට ඔවුන් සැනසුම්කර 'නියතවශයෙන්ම නබිතුමා මනුෂ්‍යයෙකි. මිනිසුන් මැරෙන සේ එතුමාද මරණයට පත්වෙන්නේය'. යනුවෙන් පැවැසීය. මිනිසුන් සැනසුම් වූහ. නබි තුමාගේ දේහය නාවා, කෆන් (ඇදුම් පැළඳුම්) කර, භූමිදානය කිරීමේ කටයුතු සියල්ල අවසන්විය.

නබි (සල්) තුමාගේ අභාවයෙන් පසු මුස්ලිම්වරුන් අබූබක්ර් සිද්දීක් (රලි) තුමාව මුස්ලිම්වරුන්ගේ කලීෆා (නායකයා) ලෙස තෝරා පත් කළහ. එතුමා කුලෆාඋර් රාෂිදීන්වරුන් (යහමග ගිය නායකයන්) අතර පළමුවන්නාය. නබිතුමා මක්කාවේ නබිත්වයට පෙර හතලිස් වසරක්ද, නබිත්වයට පසු දහතුන් වසරක්ද, මදීනා වේ දස වසරක්ද ජීවත්වීය.

# නබිතුමාගේ ගුණාංග

මුහම්මදු (සල්) තුමා මිනිසුන් අතර ඉමහත් වීරවන්තයා ලෙස සිටීය. අලී බින් අබූතාලිබ් (රලි) තුමා 'උග්‍ර යුද්ධයේ යෙදී සිටියදී හා දෙපිරිස් අතර මුහුණට මුහුණ යුද්ධය කරද්දී අපි නබි (සල්) තුමා මගින් ආරක්ෂාවෙමු'. යනුවෙන් පවසන්නේය. නබි (සල්) තුමා මිනිසුන් අතර ඉමහත් ධානවන්තයා වශයෙන් සිටියේය. එතුමාගෙන් කිසියම් දෙයක් අයැද සිටින්නේද එය නොමැති බව එතුමා නොපවසන්නේය. එතුමා මිනිසුන් අතර ඉමහත් ඉවසිලි වන්තයා ලෙස සිටීය. එතුමා තමා වෙනුවෙන් කිසියම් කෙනෙකු ගෙන් පළිගැනීම්ද, කෝපවීම්ද නොකළේය. නමුත්, අල්ලාහ්ගේ ගෞරවයන් උදාසීන කරන අවස්ථාවන් පමණක් එතුමා අල්ලාහ් වෙනුවෙන් පළි ගත්තේය. යථාර්තයෙන් තමන්ගේ අයද, අන් අයද, බලවතාද හා අසරණයාද එතුමා වෙත සමානය. යාමෙකු අන් කෙනෙකුට වඩා අල්ලාහ් පිළිබඳ බිය භක්තියෙන් (තක්වා) තොරව ශ්‍රේෂ්ඨවන්තයා නොවන බව එතුමා තහවුරු කළේය.

නියත වශයෙන්ම සෑම මනුෂ්‍යයන්ම සමානවන්තයන්ය. පැරණි සමාජයන් විනාශවූයේ ඔවුන් බලවතා සොරකම් කළේද එය නොසලකා සිටීම හා අසරණයා සොරකම් කළේද ඔහුට දඬුවම් ලබාදීම යන හේතු නිසාය. නබිතුමා 'අල්ලාහ් මත දිවුරා කියමි, මුහම්මදුගේ දියණියවූ ෆාතිමා සොරකම් කළේද නිශ්චය වශයෙන්ම ඇයගේ අත කපන්නෙමි' යනුවෙන් පැවැසීය.

නබි මුහම්මදු (සල්) තුමා කිසියම් ආහාරයක් ගැන විවේචන නොකළේය. කැමැති වුවද, එය අනුභව කළේය. අකැමැති වුවද, එය අනුභව කිරීමෙන් වැළකී සිටියේය. නබිතුමාගේ පවුලේ අය තම නිවසෙහි ලිප නොදැල්වා මාසයක් හා දෙමාසයක් ගත කළහ. රට ඉඳි හා ජලය ඔවුන්ගේ ආහාරය විය. නබිතුමා කුස ගින්න නිසා තම කුසහි ගල්ද බැඳ සිටියේය.

එතුමා තම පාවහන් තමාම මසා ගත්තේය. ඇඳුමට අණ්ඩ දමා ගත්තේය. නිවෙස් වැඩහි තම බිරිඳට සහාය දැක්විය. රෝගීන්ගේ සුවදුක් විමසීම් කළේය. එතුමා මිනිසුන් අතර ඉම හත් කීකරු වන්තයාය. පොහොසතාද දිළින්දාද උසස්වන්තයාද පහත්වන්තයාද හෝ වේවා භෝජන සංග්‍රහය සඳහා ආරාධනා කළේද එය එතුමා පිළිගත්තේය. එතුමා දුප්පතුන් (මිස්කීන් වරුන්) ප්‍රිය කළේය. ඔවුන්ගේ ජනාසාවලට සහභාගිවිය. ඔවුන්ගේ රෝගීන් සුවදුක් විමසීය. දිළින්දෙකු ඔහුගේ දිළිඳුකම නිසා නින්දා නොකළේය. රජු කෙනෙකුට ඔහුගේ රජකම නිසා බිය නොවීය. එතුමා අශ්වයා, ඔටුවා, බූරුවා හා කොටළුවා මත ගමන් බිමන් කළේය.

නබි මුහම්මදු (සල්) තුමා අධික කලබලයටද ශෝකයටද පත්
වුවද මිනිසුන් අතර මඳ සිනාවෙන් හා යහපත් ශීලයෙන් සිටිය. එතුමා මිහිරි සුවඳයන් ප්‍රිය කළේය. දුගඳයන් පිළිකුල් කළේය. අල්ලාහ් එතුමාට සම්පූර්ණ ගුණාංගයන් හා කුසල් ක්‍රියාවන් එකතුකළේය. තවද, අල්ලාහ් එතුමාට, පෙරාන්නන්ට හා පසු වැසෙන්නන්ට නොදුන් දැනුම

(ඥාණයන්) ලබා දුන්නේය. එතුමා කියවීමට හා ලියවීමට නොහැකි සාමාන්‍ය කෙනෙකි. මිනිසුන් ගෙන් කිසියම් කෙනෙකු එතුමාට ගුරුවරයෙකු නොවීය. අල්ලාහ්ගෙන් සිට මෙම කුර්ආනය එතුමා ගෙන ආවේය. එම කුර්ආනයේ අල්ලාහ් තආලා මෙසේ පවසන්නේය.

﴿قُلْ لَّئِنِ اجْتَمَعَتِ الإِنْسُ وَالْجِنُّ عَلَى أَنْ يَّأْ تُوْا بِمِثْلِ هَذَا الْقُرْآنِ لاَ يَأْتُوْنَ بِمِثْلِهِ وَلَوْكَانَ بَعْضُهُمْ لِبَعْضٍ ظَهِيْرًا﴾ (الإسراء :٨٨)

මෙම කුර්ආනය සේ එකක් ගෙන ඒම සඳහා මිනිස් හා ජින් වර්ගයන් එකතුවී (උත්සාහ කළද,) ඔවුන්ගෙන් පිරිසක් තවත් පිරිසකට සහයෝගය කළද, ඔවුන්ට මෙසේ එකක් ගෙන ඒමට නොහැක. (17:88) එතුමා උම්මී (ලියවීමට හා කියවීමට නොදන්නා) වශයෙන් සිටීම 'කුර්ආනය එතුමා ලියූ හෝ එතුමා ඉගෙන ගත් හෝ එතුමා පැරණි ග්‍රන්ථයන් මගින් උපුටාගත් හෝ එකක් බව පවසන නින්දාකාරයන්ගේ වැයමට මුඛවාඩම් බැඳීමක් වශ යෙන් පවතීය.

# නබිතුමාගේ ආශ්චර්යයන්

නියතවශයෙන්ම (නබිතුමාට පහළවූ) අල්කුර්ආනය ශ්‍රේෂ්ඨම ආශ්චර්යයෙකි. මෙය භාෂා ශෛල්‍ය පණ්ඩිතයන් පවා අසමත් කළේය. මෙම කුර්ආනයේ ඇති පරිදි පරිච්ඡේදයන් දහයක් හෝ එක් පරිච්ඡේදයක් හෝ එක් වැකියක් හෝ ගෙනෙන ලෙස අල් කුර්ආනය අභියෝග කළේය. නමුත් මුෂ්රික්වරුන් එම අභි යෝගයට මුහුණ දීමට නොහැකිවූහ.

මුෂ්රික්වරුන් එතුමාගෙන් ඔප්පුකිරීමේ සාධකයන් පෙන්වන ලෙස ඉල්ලා සිටීහ. එබැවින් ඔවුන්ට එතුමා චන්ද්‍රයා පළා පෙන්නුවේය. එය කොටස් දෙකක් වන සේ පැළීය. එතුමාගේ ඇඟිලි අතර සිට අධික වතාවන් ජලය ඉතිරීය. තම අතෙහි තිබූ ගලක් තස්බීහ් (අල්ලාහ් ප්‍රශංසා) කළේය. පසු එය අබූබක්ර් (රලි) ගේ අතේද, පසු උමර් (රලි) ගේ අතේද, පසු උස්මාන් (රලි) ගේ අතේද එතුමා තැබීය. එවිටද එය තස්බීහ් කළේය.

නබිතුමා අනුභව කරන අවස්ථාවේ එතුමාගේ ආහාරයන් තස්බීහ් කිරීම මිනිසුන් දිටීහ. නබිත්වයට පසු සමහර රාත්‍රියන් ගල් හා ගස් යනාදියන් එතුමාට සලාම් (මුබ වර්ණනා) කීහ. වහදී එතුමා මැරීම සඳහා යහුදි කාන්තාවක් තැගි කළ වහ තැවූ එළු මස් එතුමා සමග කථා කළේය. එක් අරාබිවරයෙක් තමාට සාධකයක් පෙන්වන මෙන් ඉල්ලා සිටියේය. එනිසා නබිතුමා ගලකට අණ කළේය. එය පැමිණීය. නැවත අණ කළේය එය ආපසු තම ස්ථානයට ගියේය. කිරි නැති එළුවෙකුගේ කිරි බුරුල්ල එතුමා අතින් පිරිමැද්දීය. එහි කිරි ඉතිරෙන්නට විය. එයින් නබිතුමා කිරි දොවා තමා පානය කර, අබූබක්ර් (රලි) තුමාටද පානය කිරීමට දුන්නේය. අලි බින් අබීතාලිබ් (රලි) තුමා ගේ ඇස් දෙක රෝගයට පත්වූ විට නබිතුමා තම කෙළ ඔහුගේ ඇස්හි පිරිමැද්දීය. එවිගසම එය සුවවිය. එක් සහාබිවරයෙකුගේ (අනුගාමිකයා) කකුලෙහි තුවාලයක් සිදුවිය. නබිතුමා එම ස්ථානය පිරිමැද්දීය. එවිගසම එය සුවවිය.

නබිතුමා අනස් බින් මාලික් (රලි) තුමාට දීර්ගායුෂය, අධික සම්පත්, අධික දරුවන් හා පොහොසත්කම (බරකත්) ලබාදෙන ලෙස ප්‍රාර්ථනා කළේය. ඔහුට දරුවන් 120 දෙනෙක් ඉපදීය. ඔහු ගේ රටඉඳි ගස්හි වසරකට දෙවතාවක් ගෙඩි හැදෙන්නට විය. රටඉඳි ගස්හි පොදුවෙන් වසරකට එක් වතාවක් පමණක් ගෙඩි හැදීම සිරිතකි. ඔහු වසර 120 ක කාලයක් ජීවත්විය.

නබිතුමා (දිනක්) මිම්බර්හි (දේශනා කුටිය) සිටිය අවස්ථාවේ මිනිසුන් (එවිට පැවැති) සාගතය පිළිබඳව එතුමාට පැමිණිලි කළහ. නබිතුමා අල්ලාහ් වෙත ප්‍රාර්ථනා කළේය. එවිට අහසේ වලාකුළු නොතිබින. වහාම කඳු සේ වලාකුළු නැගිට මීළඟ ජුම්ආ දිනය (සිකුරාදා) දක්වා තද වර්ෂාවක් වැස්සේය. (නැවත ඔවුන්) අධික වැස්ස පිළිබඳව නබිතුමාට පැමිණිලි කළහ. එතුමා අල්ලාහ් වෙත ප්‍රාර්ථනා කළේය. වැස්ස නැවතීය. ඔවුන් ඉර උෂ්ණයෙහි ඇවිදමින් පිටත්වූහ.

නබි මුහම්මදු (සල්) තුමා කන්දක් (යුද්ධයට සහභාගිවූ) වැසියන් දහස් දෙනාට තිරිඟු පිටි 'සාඅකින්' (සාමාන්‍යයෙන් කිලෝ දෙකහමාරක ප්‍රමාණ) හා එක් එළුවකින් ආහාර සැපයීය. ඔවුන් කුස පිරෙන්නට අනුභව කරමින් පිටත්වූහ. නමුත් එම ආහාරය සුළුවෙන් හෝ නොඅඩුවිය. මෙසේම නබිතුමා බෂීර් බින් සඃදු (රලි) ගේ දියණිය තම පියාට හා මාමාට ගෙන ආ ස්වල්ප රට ඉඳියෙන් කන්දක් වැසියන්ට ආහාරය සැපයීය.

එසේම, අබූහුරෛරා (රලි) තුමාගේ කෑම පාර්සලයෙන් සේනවියන්ට කුස පිරෙන තෙක් ආහාර සැපයීය. නබි (සල්)

තුමා මරා දැමීම සඳහා බලාපොරොත්තුවෙන් සිටි කුරෙයිෂිවරුන් එකසීය (100) දෙනාගේ ඉදිරියේ ඔවුන්ගේ මුහුණු මත පස් ඉසමින් පිටත්ව ගියේය. ඔවුහු එතුමාව නොදිටීහ. තවද, නබිතුමා මරා දැමීම සඳහා සුරාකා බින් මාලික් එතුමා පසු පස්සෙන් ලුහු බැඳමින් ගියේය. නබිතුමාව ළඟාවූ විට එතුමා ඔහුට විරුද්ධව ප්‍රාර්ථනා කළේය. වහාම ඔහුගේ අශ්වයාගේ කකුලන් පොළොවහි එරෙන්නට විය.

وصلى الله على نبينا محمد وعلى آله وصحبه وسلم

والحمد لله رب العالمين

# පටුන


| අනු අංකය | විෂය | පිටු අංකය |
|---|---|---|
| 01 | නබිත්වයට පෙර අරාබිවරුන් | 03 |
| 02 | ඇත් සටන | 05 |
| 03 | පපුව පැලීම | 08 |
| 04 | නබිත්වයට පත්වීම | 12 |
| 05 | ප්‍රසිද්ධ කැදවීම් | 15 |
| 06 | අබීසීනියාවට හිජරත් යාම | 18 |
| 07 | උමර් (රලි) ඉස්ලාමය වැළඳ ගැනීම | 19 |
| 08 | ශෝක වසර | 21 |
| 09 | තායිෆ් ගමන | 22 |
| 10 | ඉස්රා හා මිඃරාජ් | 24 |
| 11 | කැඳවීමේ නව මධ්‍යස්ථානය | 27 |
| 12 | මදීනාවේ නබිතුමා | 32 |
| 13 | බද්ර් යුද්ධය | 32 |
| 14 | උහද් යුද්ධය | 34 |
| 15 | මක්කාව ජය ගැනීම | 35 |
| 16 | නබිතුමාගේ අභාවය | 37 |
| 17 | නබිතුමාගේ ගුණාංග | 38 |
| 18 | නබිතුමාගේ ආශ්චර්යයන් | 40 |